
# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2561 ක් වූ නිකිණි මස 07 වන සඳු දින ■ 2017 අගෝස්තු මස 07 වැනි සඳුදා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ



# නිකිණි පුන් පොහොය දිනයේ වැදගත්කම

මසකට වරක් එළඹෙන පොහොය දිනය සෙසු දිනවලට වඩා සුවිශේෂත්වයක් දනවයි. එදිනට පාන්දරම සැදැහැවතුන් අවදි වී සුදෝසුදු වතින් සැරසී දෝතින් ගත් මල්ද, සුවඳ දුම්ද රැගෙන වෙහෙර විහාර වැඳ පුදගෙන සිල් සමාදන්වීම සම්ප්‍රදායයි, සිරිතයි.


නිකිණි පොහොය ද සිදුවන්නේත් මෙයමයි.

බුදුසමය අනුව යන අයගේ මූලික පරමාර්ථය, අරමුණ, එසේ නැත්නම් අදිටන වන්නේ සංසාර සාගරයෙන් එතෙරවීමය. සසර බැමි සිඳ දැමිය යුතුය. එසේ සිඳලන්නට හැකි වන්නේ තෘෂ්ණාව දුරු කිරීමෙනි. ආශාව දුරු නොකොට සසර බැමි බිඳ දැමිය නොහැකිය. බුදුරදුන් දස පාරමිතාවේදී මුලට යෙදුවේ දනයයි, නැත්නම් දීමයි. දෙන්නේ නැතිව කිසිවක් කළ නොහැකිය. සසර කෙටි කරගත නොහැකිය.

මහා සඟරුවන විවිධ ප්‍රදේශවල විසිරී-පැතිරී ඇති හෙයින් ගිහියන්ට සිය යුතුකම් ඉටු කිරීමට අවස්ථාවක් නොළැබේ. මහා සඟරුවනට දන-මාන දීම ඇප උපස්ථාන කිරීමට බොහෝ අය සැදී පැහැදී සිටිති. එහෙත් මේ අවස්ථාව බොහෝ විට මගහැරේ. මේ උපස්ථාන නිසි පිළිවෙළට කිරීමට වස් කාලය ඉඩකඩ සලසයි.

බුදුරදුන් ප්‍රඥප්ති ආවාට ගියාට පැනවූයේ නැත. යම් යම් හේතු මත විනයක් පනවන ලදී. සඟරුවනේ නිදහසට බාධා කරන්නට බුදුරදුන්ට වුවමනාවක් නොවීය. එය නිදහස් සසුන් පතට පටහැනිය. ඒ අනුව බොහෝ දුරට සිතා බලා ගැළපේද, නොගැළපේද යන්න විමසා බලා සහේතුකව, සාධාරණව පනවන ලද බව සත්‍යයකි. සිවු මසක් පමණ වැසි පවතින බැවින් ස්වකීය පන්සලට, අරමට වී "වස්සික සාටිකය" හෙවත් "වැසි සළුව" වස් වසන භික්ෂූන් විසින් වස් වසන දිනයෙහිම අධිෂ්ඨාන කොට වස් සාර මාසයෙහි පරිහරණය කළ යුතු සිවුරක් ලෙස නියම කොට ඇත.

නාන කඩය යනුවෙන් හඳුන්වන මේ චීවරය සඟරුවනට වාග් විඥප්තියෙන් වුවද ඉල්ලාගෙන පරිහරණය කළ හැකි වස්ත්‍රයක් වශයෙන් සලකනු ලැබේ. මෙය භික්ෂූන්ට ලබාගැනීමට ප්‍රථමයෙන්ම කටයුතු කරන ලද්දේ විශාඛා මහෝපාසිකාවගේ ඉල්ලීමකට අනුවය. වැස්සෙන් පීඩා විඳින සංඝරත්නය දුටු විශාඛාවන් "**ඉච්ඡා මහං භන්තෙ සංඝස්ස යාවජීවං වස්සික සාටිකං ධාතුං**" යනුවෙන් "ස්වාමීනි, මම දිවි ඇති තාක් සංඝයාට වැසි සළු පුදන්නට කැමැත්තෙමි." ඇයගේ බසට



කන්දීමක් වශයෙන් බුදුරදුන් "**අනුජානාමි භික්ඛවෙ වස්සික සාටිකං වස්සානං චාතු මාසං අධිට්ඨාතුං තතොපරං විකප්පෙතු**" යනුවෙන් "මහණෙනි, වස් සාර මසෙහි වැසි සළුව අධිෂ්ඨාන කොට ප්‍රයෝජනයට ගන්නටත්, එයින් පසු විකප්පනය කරන්නටත් අනුදන වදරමි" යි වදළහ.

වස්සාන කාලයෙහි සැදැහැවතුන් සඟරුවන වෙසෙන ආරාමයට ගොස් නිරම පින් දහම් කටයුතුවල යෙදීම මත ජීවිතයේ යථාර්ථය තේරුම් ගැනීමට නිකිණි පොහොය උපස්ථම්භක වේ.

දිනක් රහතන් වහන්සේ නමක් නියරක් උඩින් ගමන් ගන්නා විට, බීමත් මිනිසකු කිසිම සංවරයක් නොමැතිව රහතන් වහන්සේ ගැන කිසිදු ගෞරවයක්, ගරුසරු කමක් නොමැතිව නියර උඩින් ගමන් ගන්නා රහත් නමගේ ඇඟේ හැපී එම හිමියන් වෙලට නැත්නම් කුඹුරට වැටුණි. මේ සිද්ධිය දුටු තවත් අයකු වැටී සිටි රහත් නම නැගිට්ට වන ලදී. බීමත්ව හැසිරුණු මනුෂ්‍යයා ලොකු වරදක් කළ බව නැගිට්ටවන ලද අය ගතු කියන ලදී. එවිට රහත් හිමියන් කියා සිටියේ නැත නැත. ඔහු කිසිදු වරදක් මට නොකළ බවය. ඔබ කළ දෙයට ඔබට ප්‍රතිඵල ගෙන දෙන්නා සේ එම පුද්ගලයා කළ දෙයට ඔහුට ප්‍රතිඵල ගෙන දෙන බවයි. මේ අනුව යහපත් මිනිසකු බවට පත් කිරීමේ පුද්ගල විඥනය හසුරු වන්නේ නිකිණි පොහොයයි.


මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පන්සියයක් රහතන් වහන්සේ විසින් පවත්වන ලද ප්‍රථම සංගායනාව ආරම්භ කරන ලද්දේ නිකිණි පෝදකය.

ආනන්ද හිමියන් රහත් වූයේද නිකිණි පුන් පොහෝදකය.

නිකිණි පුන් පොහොය දින වෙනත් පොහොය දින මෙන් සිද්ධි සමුදයක් සිදු නොවුණද පුද්ගලයාගේ සසර ගමන කෙටි කරගැනීමට සිත එකග කරගෙන මෝක්ෂ මාර්ගයකට පිවිසීමට හේතු භූත වන කරුණු සමුදයකට මේ පොහොය දිනදී දෙරටු විවර වූ බව සිහි තබා ගත යුතුය.

ශාක්‍ය ඉඳුවර ගුණසේකර

# නිවන් දොර වළකන පසිඳුරන් හඳුනා ගනිමු



පොහෝ දිනයන්වල උපෝසථය සමාදන්ව කටයුතු කරනු ලබන උපාසක උපාසිකාවන් විසින් පංච නීවරණ ධර්මයන් හඳුනාගෙන දුරු කළ යුතු වේ. පංච නීවරණ යනු චිත්ත දියුණුව නැති කර විදර්ශනා ප්‍රඥාවට බාධා ඇති කරන සිත දියුණුවට යන ගමන අඩාල කරන ධර්ම පහකි. මෙකී කරුණු දුරු නොකළහොත් සීල සමාදනයෙන් අපේක්ෂා කරනු ලබන අරමුණු සපුරා ගැනීමට නොහැකි වේ. එහෙයින් මෙම නීවරණ ධර්මයන් මනාව හඳුනා ගත යුතු වේ.

1. කාමච්ඡන්දය: තමන් ආස කරනු ලබන රූප, ශබ්ද, ගන්ධ, ස්පර්ශ කෙරෙහි සිත නිතර ඇදී යන ස්වභාවය කාමච්ඡන්දය ලෙස හඳුන්වයි. මෙම සිතුවිල්ලෙහි ප්‍රතිඵල භාවනාවෙහි යෙදී සිටියදී හෝ එයට පෙර පසු ලැබේ.
2. ව්‍යාපාදය: තමන්ට දනුණ අරමුණ (ඇසින් දුටු රූපය හෝ කනින් ඇසූ ශබ්දය, ගන්ධය, ස්පර්ශය) ආදීන් කෙරෙහි ගැටීමත්, තරහක්, වෛරයක්, ඊර්ෂ්‍යාවක් හෝ නොරුස්සන ගතියක් ඇතිවීම ව්‍යාපාදය නම් වේ.
3. ථීනමිද්ධය: තම සිත දියුණුවට අදාළ බණ, භාවනාදියට සිත මැලිවීම, අලස ගතියක්, කම්මැලි සිතුවිලි ඇතිවීම.
4. උද්ධච්ච කුක්කුච්ච: තමාගෙන් වුණ හෝ නොවුණ වැරදි ගැන සිත සිතා විපිළිසර වීම.
5. විචිකිච්චාව: තමා අනුගමනය කරන දහම් මග පිළිබඳව හෝ තමා හට යමක් කිරීමට හැකිවේද යන දෙබිඩි සහගත චේතනාව, සැකය, අවිශ්වාස ස්වභාවය.

මෙසේ ථීනමිද්දදී පංච නීවරණ ධර්මයන් දුරලන සීල සමාදනයේ නියළුණ උපාසක උපාසිකාවන් විසින් භාවනාවට සිත යොමු කළ යුතු වේ. බෞද්ධ දර්ශනය තුළ භාවනාව, සමථය, විදර්ශනාව වශයෙන් කොටස් දෙකක් පෙන්වා දී ඇති අතර විදර්ශනා භාවනාව බුදු දහමටම පමණක් ආවේනික නිර්වාණගාමී භාවනා මාර්ගය වේ. සමථ භාවනාවන් අන්‍ය ශ්‍රමණ ශාසනයක් තුළද දක්නට ලැබේ. සමථ භාවනාව තුළින් පඤ්ච නීවරණයන් යටපත් කරනු ලබන අතර සිත දියුණු කිරීම, සිත ඒකාග්‍ර කොට සිතේ විසිරෙන ගතිය නැති කිරීම එක අරමුණක සිත පිහිටුවීමට සමථය උපකාරී වේ. විදර්ශනා භාවනාව තුළින් විදර්ශනා ප්‍රඥාව ඇති කරන අතර ජීවිතාවබෝධය ලබාදේ. අනිත්‍ය දුක්ඛ අනාත්ම ආදී වශයෙන් ලෝකයේ පවතින යථා ස්වභාවය විදර්ශනා භාවනාව තුළින් මෙනෙහි කෙරේ.

භාවනාවට යොමුවන උපාසක උපාසිකාවන් විසින් සම්මා සතිය වර්ධනය කරගැනීමට වෙර වැඩිය යුතු වේ. මන්ද සතිය හෙවත් සිහිය ඉතා වැදගත් වේ. යෝනිසෝ මනසිකාරය යනුද එළඹ සිටි සිහියෙන් යුතු වීමය. එනම් සම්මා සතියෙන් යුතුව සිත මෙහෙයවීමය. මෙකී සම්මා සතිය දියුණු කරගැනීමට නම් සතර සතිපට්ඨානය වැඩිය යුතු වේ.


**පූජ්‍ය හල්මිල්ලකුලමේ සුජාතඥාන හිමි**

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."


# ඔබ දැනගතම යුතු ඇසළ පෙරහර මංගල්ලයේ සැඟවුණු කතාව

පෙරහර පැවැත්වීම සිංහල ජාතියේ ආරම්භයේ සිටම පැවත එන්නකි. පෙරහර යන වචනයෙන් අවධාරණය වන්නේ සැලකිල්ල, රැකබලා ගැනීම, ගෞරවය, වරප්‍රසාදය, උදුරත්වය හා පෙරට යාම වැනි අරුත්ය. එය පෙරහර ලෙස වඩාත් අර්ථවත් වන්නේ බුදුරජාණන් වහන්සේ හෝ අනෙකුත් පූජනීය වස්තූන්, පූජනීය උතුමකු හෝ වෙත ගෞරවය දැක්වීමේ සත්කාරයක් ලෙසිනි.

විජය රජු, පඬු රජුගේ දුව මහා පෙරහැරෙන් අගමෙහෙසි තනතුරේ අභිෂේක කළ බැව් මහා වංශයේ සඳහන් වේ. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ දඹකොළ පටුන සිට අනුරාධපුරය දක්වා පෙරහැරෙන් වැඩම කළ බව අප කවුරුත් දන්නා අසා ඇති කරුණකි. මේ අනුව පෙරහැර පැවැත්වීම සිංහල ජාතියේ ආරම්භයේ සිට පැවැති බව ඉතිහාසය පුරාම සනාථ වී ඇත.



''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''



බුදුරජාණන් වහන්සේගේ දේශනාව වනුයේ බාහිර ආමිෂ පූජාවන්ට වඩා ප්‍රතිපත්තිවලට මුල් තැන දිය යුතු බවය. පෙරහැර පැවැත්වීම බුදුරජාණන් වහන්සේගේ දේශනාවලට හෝ ප්‍රතිපත්තිවලට හෝ අනුකූල හෝ අනුකූල නොවේ යැයි තර්ක කළ නොහැක. පෙරහැර අනාදිමත් කාලයක සිට පැවැත එන අතර එය බෞද්ධයන්ගේ ජන ජීවිතය හා බැඳී පවතී.

සර්වඥ ධාතුන් වහන්සේලා අතර ශ්‍රී දළදා වහන්සේට අයිති වන්නේ වැදගත් අද්විතීය ස්ථානයකි. දන්ත ධාතුන් වහන්සේට අන් කිසිම පූජනීය වස්තුවකට නොලැබුණ අන්දමේ රාජ්‍ය ගෞරවය හා සැලකිල්ල ලැබිණ. ඒ නිසාම මහනුවර දළදා මාලිගාව ලෝක බෞද්ධවාසීන්ගේ අතිශය පූජනීය ස්ථානයක් බවටද පත්ව ඇත. දළදා මාලිගාව හා එහි ඉතිහාසයද ඉතා සිත්ගන්නා සුළුය. දළදා වහන්සේ කාලිංග දේශයේ සිට ශ්‍රී ලංකාවට වැඩමවා ගෙන ඒමට හේතු වන්නේ දළදා වහන්සේ අත්පත් කරගැනීම සඳහා සතුරන් සමග කළ සටනින් ඉන්දියාවේ කාලිංග දේශයේ ගුහසීව රජතුමා පරාජය වීම හේතුවෙනි. ඒ නිසා දළදා වහන්සේ ආරක්ෂාව පතා එය ශ්‍රී ලංකාවට ගෙන එන ලද්දක් බැව් ඉතිහාස පුරාවෘත්තයන්හි සඳහන් වේ.

දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම වූ අවධියේ රාජ්‍යත්වය දැරුවේ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජතුමාය. දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවූයේ බෞද්ධ සභ්‍යත්වය හා සංස්කෘතිය ශ්‍රී ලංකාව තුළ තහවුරු වී ශතවර්ෂ ගණනාවකට පසුවය. ඓතිහාසික පුරාවෘත්තවලට අනුව දළදා පෙරහැර ආරම්භ වී ඇත්තේ දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කළ 4 වන සියවසේ රජ කළ කීර්ති මේඝවර්ණ රජු (ක්‍රි.ව. 301-328) සමයේදීය. රජතුමාගේ රාජකීය මාලිගාව අසල දළදා මන්දිරයක් ඉදිකර ඇත. මෙම දළදා පෙරහැර දළදා මන්දිරයේ සිට අභයගිරි විහාරයට පෙරහැරින් වැඩමවාගෙන විත් දළදා ප්‍රදර්ශනය කළ බැව් ඉතිහාසයේ සඳහන් වේ. දළදා වහන්සේට පුද පූජා පවත්වන චාරිත්‍ර ක්‍රමයන් පිළිබඳ රජු විසින් විධිවිධාන පනවා තිබිණ. මෙලෙස දළදා වහන්සේ පෙරහැරෙන් වැඩම කර ප්‍රදර්ශනය කිරීම 5 වන සියවස දක්වාම පැවැති බව පෙරහැර සියැසින් දුටු චීන දේශාටන වාර්තාකරුවකු වන ෆාහියන්ගේ සටහන්වලින් අනාවරණය වේ. ෆාහියන්ගේ වාර්තා අනුව සෑම වර්ෂයකම තුන්වන මාසයේ දළද පෙරහර පවත්වා ඇත. බුද්ධ වර්ෂ අනුව තුන්වන මාසය යනු ඇසළ මාසයයි. රජ ඇඳුම්වලට සමාන ඇඳුම් ආයිත්තම් පැළඳ ගත් අණබෙරකරුවකු ඇතකු පිට නැගී දළද පෙරහර පවත්වන බව පෙරහරට දින දහයකට කලින් ගම් නියම් ගම්වල ප්‍රචාරය කිරීමට කටයුතු කර තිබේ. අණබෙරකරුවකු යැවීමෙන් අනතුරුව පන්සීයක් ජාතක කතාවල සඳහන් බෝධිසත්ව චරිත ප්‍රතිමාවල නංවා පෙරහර ගමන් කරන පාර දෙපස තබා තිබූ බව හා එකී ප්‍රතිමා ජීවමාන ස්වරූපයෙන් පිළිබිඹු වූ බව පාහියන් සඳහන් කරයි.

# දළදා වහන්සේ සඟවා තබපු තැන්

හියුං සාංගේ ගවේෂණ සටහන් අනුව දිනකට තෙවරක් දළද වහන්සේ සුවඳ පැණින් ස්නානය කොට ඇත. මෙම පුද පූජා සඳහා යොදගත් භාජන මැණික් අල්ලා රනින් නිම කළ භාජන බවද හියුං සාං තවදුරටත් විස්තර කර ඇත. එවකට පැවැති පෙරහර හුදු විනෝදය හා ප්‍රීතිය සඳහා පැවැති එකක් නොවේ. එය බුදුරජාණන් වහන්සේට දක්වන අපිරිමිත ගෞරවය හා භක්ති ප්‍රණාමය පුද කරන්නක් විය. මෙලෙස පෙරහැර පැවැත්වීමෙන් බුදු



දහම පිළිබඳ කිසියම් අවබෝධයක් ලබා දෙමින් ධාර්මික ජීවිතයකට මිනිසුන් නැඹුරු කරවීය. කිත්සිරි මේඝවර්ණ රජුගෙන් පසුව රජවරුන් කීපදෙනකුම අනුරාධපුරය පාලනය කළද එකී රාජ සමයන් තුළ දළද පෙරහැර පැවැත්වූ බවට සටහන් නොමැත. ඒ අනුව දළද පෙරහැර නොපැවැත්වූවා යන නිගමනයට එළඹිය නොහැක. මහාවංශ කතුවරයා, දළද වහන්සේ පිළිබඳ විස්තර දක්වා ඇත්තේ අල්ප වශයෙනි. ධාතුසේන රජතුමාගේ රාජ පාලන සමයේදී (ක්‍රි.ව. 455-473) නටඹුන්ව පැවැති දළද මාලිගය පිළිසකර කර කරඬුවක්ද පූජා කර ඇත. පළමුවන අග්ගබෝධි රජතුමා (ක්‍රි.ව. 571-574) සමයේදී දළද මන්දිරය අතිශයින් වටිනා දිළිසෙන මැණික් ගල්වලින් අලංකාර කොට දන්ත ධාතු කරඬුවක්ද පූජා කළ බව සඳහන් වේ. මෙතැන් සිට සියවස් තුනකට අධික කාලයක් එනම් සිව්වන මිහිඳු රජතුමගේ (ක්‍රි.ව. 956-972) කාලය දක්වා දළද වහන්සේ පිළිබඳ වාර්තා සඳහන් නොවේ.

අනුරාධපුර සමයේ පවත්වනු ලැබූ දළද පෙරහැරට වඩා පොළොන්නරු සමයේ පැවැති පෙරහැර පෙරහැරක පැවැතිය යුතු සියලුම අංග ඇතුළත් කර තිබිණ. එය මහනුවර සමයේ පැවැත්වූ පෙරහැරට බෙහෙවින් සමාන වී ඇත. පෙරහැරේ ගෙන යනු ලබන ධජ පතාක, සේසත්, විවිධ සංස්ථාවල හා රජු යටතේ පැවැති ප්‍රදේශවල සහභාගිත්වය දක්වෙන ප්‍රාදේශීය පළාත් කොඩි දළද පෙරහැරේ රැගෙන ගොස් ඇත. එය දළද වහන්සේට උපහාර දැක්වීමක් හා රජුගේ බලපරාක්‍රමය විදහා දැක්වීමක්ද විය.

දඹදෙණි රාජ්‍ය පාලන සමයේදී පණ්ඩිත පරාක්‍රම රජු (ක්‍රි.ව. 1236-1270) කාලයේදීද ඉතා උත්කර්ෂවත් අන්දමින් දළද පෙරහැර පවත්වා ඇත. දඹදෙණි සමයේදී පැවැත්වූ දළද පෙරහැරේ විශේෂත්වයක් දක්නට තිබිණ. එහි විශේෂත්වය වන්නේ විශේෂිත ස්ථානයක් කරා පෙරහැර වැඩම කරවීමය. එය රජුගේ උපන් ගම වන සිරිවර්ධනපුරයට හා දඹදෙණියේ විජේසුන්දරාරාමයට වැඩම කරවීමය. පරාක්‍රමබාහු රජුගේ උපන් ගම වන සිරිවර්ධනපුරය කොතැනක පිහිටියේදැයි තවමත් නිශ්චිතව හඳුනාගෙන නැත. පෙරහැරේ ගමන් මාර්ගය අඩ යොදුනක් එනම් සැතපුම් තුනක් පමණ වූ බව සඳහන් වේ. ඒ අනුව සිරිවර්ධනපුරය තිබී ඇත්තේ දඹදෙණිය රජවාසල හා ශ්‍රී දළද මාලිගය ආසන්නයේ විය හැක. පෙරහැර ගමන් කරන මාර්ගය සුදු වැලි අතුරා ධජ පතාක එල්ලා මග දෙපස මාරුක්, තැඹිලි, බෝදිලි, නවසී, තල්, කිතුල්, කදලි ආදී ගස් සිටුවා අලංකාර කර තිබී ඇත. පෙරහැර ගමන් කරන මග දෙපස පුන් කලස් තබා සරසා ඇත. සෑම පස් රියනක් ඇතුළත රාජකීය තොරණක්ද පට තොරණක් හා විසිතුරු බුද්ධ ප්‍රතිමාද තබා පෙරහැරට වඩා අංගෝපාංග ඇතුළත්ව තිබිණ.

අනුරාධපුරය හා දඹදෙණි යුගවල පැවැති පෙරහැරවලදී දළද වහන්සේ දළද මන්දිරය සිට දින 90 ක් වැඩ හිඳුවා පුද පූජා පවත්වා ඇත. එවැනි චාරිත්‍රයක් පොළොන්නරු සමයේ තිබුණු බවට සාක්ෂි හෙළිදරව් නොවේ. දඹදෙණි අස්නට අනුව දළද පෙරහැරට දේවාල පෙරහැර ඇතුළත්ව තිබූ බව සඳහන් වේ.


"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."

# එක් එක් රජවරුන් දළදා වහන්සේ වෙනුවෙන් කළ පුද පූජා

යාපහුව රාජධානියේ දළදා වහන්සේ වැඩ සිටි බවට තොරතුරු සාධක පැවැතියත් පෙරහැර පිළිබඳ විස්තරයක් වංශ කතාවල සඳහන් නොවේ. එසේ වුවත් දළදා පෙරහැර පැවැත් නොවූයේ යැයි නිගමනයකට එළඹිය නොහැක.

කුරුණෑගල රාජ සමය තුළ දළදා පෙරහැර පැවැත්වූ බවට සඳහන් වන්නේ අල්ප වශයෙනි. 4 වන පණ්ඩිත පරාක්‍රම රජ (ක්‍රි.ව. 1302-1326) සමයේ රචිත දළදා සිරිත අනුව දළදා පෙරහැර පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් සඳහන් වේ. දළදා වහන්සේගේ පුද පූජා කටයුතුවල ව්‍යවස්ථා පද්ධතියක් පිළිබඳව සඳහන් වන්නේ කුරුණෑගල සමයේදීය. එහි දළදා පෙරහැර හා දළදා ප්‍රදර්ශනය ඇරඹීමට පෙර හා පසුව අනුගමනය කළ යුතු චාරිත්‍රවිධි පිළිබඳ විස්තරයක් සඳහන් වේ. සුබ නැකත් බලා දළදා මාලිගය පිරිසිදු කර වියන් බැඳ නොයෙකුත් නානාවිධ පිළිවෙත් මගින් විසිතුරු කොට සරසා රජ, ඇමැතිවරු, අන්තඃපුර ස්ත්‍රීන් හා නගර වැසියන් එක්ව සත් දවසක් මුළුල්ලේ බත් මල්, පහන්, මහ පෙරහැරින් පූජා පැවැත්වූ බව සඳහන් වේ.





කුරුණෑගල සමයේදී දළදා පෙරහැර හා දළදා ප්‍රදර්ශනයේ කිසියම් නීති මාලාවක් අනුව අනුපිළිවෙළක් යටතේ කාලානුරූපව හා ක්‍රමවත්ව සංවිධානය කිරීමට මූලික උත්සාහයක් දරා ඇති බව පෙනේ. මෙය දළදා පෙරහැර පිළිබඳ ඉතිහාසයේ වැදගත්ම ස්ථානයක් ගනී. දළදා වහන්සේගේ භාරකාරත්වයෙන් හරි අඩක් භික්ෂූන් වහන්සේලාට පැවැරී තිබිණ. භික්ෂූන් වහන්සේලා පිරිත් දේශනා කරමින් පෙරහැරේ වැඩම කරවූ බව වාර්තා වේ. දළදා වහන්සේ පෙරහැරේ වැඩම කළ දළදා රථය නමින් හැඳින්වූ අලංකාරව නිමවන ලද රථයකිනි. දළදා වහන්සේ ආරක්ෂා කිරීමේ කාර්යය පැවැරී තිබුණේ 'ගණවැසි' හා 'කිලිං' යන කුල දෙකටය. ගණවැසි යනු විහාරයේ නිලධාරියා බව මහාචාර්ය පරණවිතානගේ මතයයි. කිලිං යනු කුලිංග නම් කුලයයි. ශ්‍රී මහා බෝධිය ශ්‍රී ලංකාවට වැඩම කරවීමේදී පැමිණි අටළොස් කුලයන්ට කිලිං කුලය අයත් විය. ගණවැසි හා කිලිං කුල දෙදෙනා දළදා රථය දෙපසින් ගමන් කරමින් දළදා වහන්සේට ආරක්ෂාව සපයා ඇත. දළදා ප්‍රදර්ශනයෙන් පසු දළදා වහන්සේ දළදා කරඬුවේ තැන්පත් කොට යතුරු දමා මුද්‍රා තබා ඇත්තේ රජු ඉදිරියේදීය. මහනුවර රාජ සමය තුළද මෙකී නියමයන් පවත්වාගෙන ගොස් ඇත. වර්තමාන දළදා ප්‍රදර්ශනය විකාශනය වී ඇත්තේද මෙකී ව්‍යවස්ථානුකූල තත්ත්වයන්ට අනුකූලවය.

කුරුණෑගල සමයෙන් පසු මහනුවර සමය දක්වාම දළදා පෙරහර පිළිබඳ විශ්වාස කළ හැකි තොරතුරු අනාවරණය වන්නේ නැත.

කුරුණෑගල රාජධානි සමයේ ඇතිවූ දේශපාලන අස්ථාවරයන් නිසා දළදා වහන්සේ ආරක්ෂාව සඳහා කුරුණෑගල සිට ගඟසිරිපුර (ගම්පල), නියම්ගම්පාය විහාරස්ථානය වෙත රැගෙන ගොස් ඇත.

18 වන සියවසේ රචිත දළදා වහන්සේ අනුව තුන්වන වික්‍රමබාහු රජු විසින් දළදා පෙරහැර පැවැත්වූ බැව් සඳහන් වේ. විදුලවත්ත ශිලා ලිපිය අනුව ක්‍රි.ව. 1360 දී ගම්පල කුඹුරෙන් ලැබූ වී අස්වැන්න දළදා වහන්සේට පූජා කළ බැව් සඳහන් වේ. මෙම ඓතිහාසික මූලාශ්‍ර අනුව නියම්ගම්පාය විහාරයේ දළදා වහන්සේ තැන්පත් කර තිබූ බැව් තහවුරු වේ. එහෙත් චූලවංශය අනුව ශ්‍රී දළදා වහන්සේ ගම්පොළට රැගෙන ආ බවක් සඳහන් නොවේ. 5 වන බුවනෙකබාහු රජතුමා (ක්‍රි.ව. 1372-1408) සිය පාලන අගනුවර කෝට්ටේ වෙත ගෙන ගිය නිසා දළදා වහන්සේද කෝට්ටේට රැගෙන යන ලදී. කෝට්ටේ රජ මාලිගාව ආසන්නයේ ඉදිකළ අලංකාර මන්දිරයේ දළදා වහන්සේ තැන්පත් කර තිබිණ. කෝට්ටේ රාජ සමයේදී දළදා වහන්සේ පිළිබඳ තොරතුරු අනාවරණය වුවත් දළදා පෙරහැර පිළිබඳ තොරතුරු අනාවරණය නොවේ. සංදේශ කාව්‍යවල දක්වෙන ගමන් මග වර්ණනාවන් අනුව දළදා මාලිගය ගැන සඳහන් වුවත් දළදා පෙරහැර ගැන සඳහන් නොවේ. දළදා පෙරහැර දළදා වහන්සේ සමග බැඳී පවත්නා අනිවාර්ය කරුණකි. ඒ නිසා දළදා පෙරහැර ගැන විස්තර සඳහන් නොවුණද දළදා පෙරහර නොපැවති බව පිළිගත නොහැක. දළදා පෙරහැර දළදා වහන්සේ සමග අඛණ්ඩව පැවැති චාරිත්‍රයකි. කෝට්ටේ යුගයේදී එය සතර දේවාල පෙරහැරට එකතු වූ බව අනුමාන කරනු ලැබේ. කෝට්ටේ පිහිටි දළදා මන්දිරය අවට සතර පසින් සතර දේවාල පිහිටා තිබූ බව සඳහන් වේ. ඈත අතීතයේ සිට බුදු සමය සමග දෙවියන් ගමන් කොට තිබූ අතර දෙවියන් බුදුරදුන් සමග සම තත්ත්වයට පැමිණියේ නැත.

කෝට්ටේ යුගයේ දෙන් ජුවන් ධර්මපාල රජු ක්‍රිස්තියානි ආගම වැළඳ ගැනීමත්, පෘතුගීසි ආක්‍රමණ හේතුවෙන් දළදා වහන්සේ ආරක්ෂා කිරීම බලවත් ප්‍රශ්නයක් විය. බෞද්ධයන්ගේ පිළිගැනීම හා බුද්ධාලම්භන ප්‍රීතිය විනාශ කිරීම සඳහා පෘතුගීසීන් විසින් දළදා වහන්සේ අල්ලාගෙන විනාශ කළ බවට බොරු ප්‍රචාර ගෙන යන ලදී. මෙවැනි දේශපාලනික හා සමාජ වාතාවරණයක් තුළ දළදා පෙරහැර පවත්වනවාට වඩා දළදා වහන්සේ ආරක්ෂිතව තබා ගැනීමට සියලු උත්සාහයන් දරා තිබේ. එහිදී දළදා වහන්සේ දෙල්ගමුවට ගෙන ගොස් කුරක්කන් ගලක් තුළ සඟවා තබා ඇත. මේ නිසා කෝට්ටේ යුගයේදී සතර දේවාල පෙරහැර කිසිදු අවහිරයකින් තොරව පවත්වාගෙන යාමට හැකිවී ඇත.

මහින්දගමනයෙන් පසු ලක් වැසියන් බුදු දහම වැළඳ ගත් නමුදු ඊට පෙර පැවැති දෙවියන් හා යක්ෂයන් ඇදහීම සම්පූර්ණයෙන් අභාවයට ගොස් තිබුණේ නැත. එසේම වරින් වර ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ ද්‍රවිඩයන් නිසා දේව ඇදහීම් ඉස්මතු වෙමින් පැවැතිණි. පොළොන්නරු යුගයේද මෙම මිථ්‍යා දේව ඇදහීම් ඉස්මතු විය. එය ජනප්‍රියද විය. සිංහල රජවරුන් ඉන්දියානු ද්‍රවිඩ කාන්තාවන් සමග විවාහ වීම නිසා හින්දු දෙවියන්ටද මේ රටේ ඉහළ ස්ථානයක් හිමිවිය. බෞද්ධ භික්ෂූන් විසින් දෙවියන්ට පුද සත්කාර පැවැත්වීම ආරම්භ වූයේ කෝට්ටේ යුගයේදීය. මිනිසාට මුහුණ පාන්නට වන විවිධ කරදරවලදී ජීවිතය පිළිබඳව අපේක්ෂා භංගත්වයක් ඇතිවීමෙන් අදෘශ්‍යමාන බලවේගවල පිළිසරණ පැතීමට යොමු වේ. එසේම මිනිසා ධර්ම ඥානයෙන් තොර වන විටද ඔහු සතු ගුණ දහම් පිරිහී ගොස් මිථ්‍යා සංකල්පවලට යොමු විය. කෝට්ටේ සමයෙන් පසු ඇතිවූ අඳුරු යුගයේ භික්ෂූන්ද පිරිහීමට පත්විය.

මහනුවර යුගයේ සිටි රජවරුන් බුදු දහමටත්, බෞද්ධ සංස්කෘතියටත් අනුග්‍රහයන් ලබාදී ඇත්තේ දේශපාලනික වශයෙන් සිදුවිය යුතුව තිබූ මෙහෙයුම් අනුවය. මහනුවර සමයේ බලයට පත්වූ රජවරු සිංහල රජ පෙළපතට අයත් වූවත් නොවේ. ඔවුන්ගේ


''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

# පෙරහරේ ආරම්භය පිළිබඳ ඇති විවිධ මත

බිසෝවරු දකුණු ඉන්දියාවෙන් ගෙන්වූ ද්‍රවිඩ කුල කාන්තාවන් විය. එකී කාන්තාවන්ගෙන් සිදුවූ හින්දු ආගමික බලපෑම් ඉතා බලවත් විය.

1590 දී පෘතුගීසීන් උඩරටින් පන්නා දමා සිංහල රාජ්‍යයක් ගොඩ නැගූ පළමුවන විමලධර්මසූරිය රජු මුලදී බෞද්ධයකු නොවීය. දොන් ජුවන් නමින් භෞතීස්ම ලැබූ ඔහු ගෝවේදී කතෝලික අධ්‍යාපනය ලද අයෙකු විය. රාජ්‍ය උරුමය තමන් වෙත තහවුරු කර ගැනීමට ඔහු දෙල්ගමුවේ සඟවා තැබූ දළදා වහන්සේ මහනුවරට වැඩම කරපා වාර්ෂික ඇසළ පෙරහැර ආරම්භ කළ අයෙකි. ඇසළ පෙරහැර සිදුකළේ දළදා වහන්සේ උදෙසා නොව සතර දේවාලවල දෙවියන් උදෙසාය. කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ දළදා පෙරහැර ඇසළ පෙරහැරට සම්බන්ධ නොවූ බව මහා වංශයේ සඳහන් වේ. එවකට පැවැති රටේ චාරිත්‍ර අනුව රජු බෞද්ධයකු වුවත් ඔහුට ජාතික සිරිත් විරිත් හෝ ආගමික පුද පූජා පිළිවෙත් පිළිබඳ හෝ අවබෝධයක් නොවීය. අවශ්‍ය ප්‍රමාණයට භික්ෂූන් නොමැතිව බුදු සසුන පිරිහී තිබිණ. දළදා පෙරහරේ පෞරාණික ස්වරූපය කුමක්දැයි අවබෝධ කරගැනීමට හෝ දළදා වහන්සේ එහි වැඩමවීම චිරාගත සම්ප්‍රදයක් යැයි අවබෝධ කරගැනීමට රජුට හෝ භික්ෂූන්ට නොහැකි විය. මෙම යුගයේදී බලයට පත් සෙනරත් රජු කලින් භික්ෂුවක ලෙස පැවිදිව සිටි අයකු වුවද ඔහුටද අවබෝධයක් නොවීය. දෙවන රාජසිංහ රජු ඇසළ පෙරහර මුළුමනින්ම නවතා දමන ලදී. මේ නිසා මහජනතාව කෝපයට පත්ව අරගල කිරීම රජුට විරුද්ධව කැරැල්ලක් දක්වා ව්‍යාප්ත විය. දෙවන විමලධර්මසූරිය රජු බුදු දහම වෙනුවෙන් මහත් සේවාවක් කළ අයකු වුවද ඇසළ පෙරහැර වැනි ජාතික උත්සවයක් චිරාගතව පැවැති චාරිත්‍ර අනුව බෞද්ධ සංස්කෘතියට අනුකූලව සකස් කර ගැනීමට ඔහු අපොහොසත් විය.





වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු හුදු විනෝදකාමියෙක් විය. දළදා මාලිගය පිළිසකර කිරීම වැනි බෞද්ධ කටයුතු සිදු කළද ජාතික සිරිත් විරිත් පිළිබඳ අවබෝධයන් නොවීය. ඔහුගේ කුළුපග මිතුරන් වූයේ ජෝසප් වාස්, ගොන්සාලෙස් වැනි කතෝලික පාදිලිවරුන්ය. ඔවුන්ට සිත්සේ කතෝලික ධර්මය ප්‍රචාරය කිරීමට ඉඩ දී තිබිණ. පල්ලියක් ඉදිකිරීම සඳහා රජ වාසල අසල ඉඩමක්ද පරිත්‍යා කර ඇත. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු මිය යන අවස්ථාවේදී ක්‍රිස්තියානු පල්ලියේ ශුද්ධ වූ ජලය ගෙන්වා ගෙන පානය කළ බව සඳහන් වේ. රජුන්ට අනුශාසනා හා උපදේශකයන් වූ භික්ෂූන් වහන්සේලාද ගුණධර්මවලින් පිරිහුණු ධර්මය නොදන්නා වූ පිරිසක් විය. ඒ නිසා මෙවැනි පාලකයන්ගෙන් උසස් බෞද්ධ සංස්කෘතියක ප්‍රබෝධයක් නොවීය. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගෙන් පසු බලයට පත්වූයේ නායක්කර වංශික ද්‍රවිඩ රජුන්ය. ඔවුන් බුදු සමයේ අභිවෘද්ධියක් ඇති කිරීමට උදව් කළද බෞද්ධ සංස්කෘතියේ පෙර තිබූ ප්‍රබෝධයක් ඇති කිරීමට අසමත් විය. රටේ පැවැති සම්මත හා චාරිත්‍රයන් අනුව බුදු දහම වැළඳ ගත්තද සමස්ත බලය ලැබී තිබුණේ දෙමළ නායකයන්ට හා ද්‍රවිඩ දෙවිවරුන්ටය. නායක්කර් වංශික රජවරුන් විවාහ කර ගත්තේ දකුණු ඉන්දියානු දෙමළ කාන්තාවන්ය. මෙම විවාහයන් නිසා තව තවත් ද්‍රවිඩ පිරිස් කන්ද උඩරටට ගලා ආවේය. මොවුන් ඇති කළ ද්‍රවිඩ සංස්කෘතිය රටේ එතෙක් පැවැති සංස්කෘතිය විපර්යාසයකට භාජනය විය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු දක්වාම බෞද්ධ පුනර්ජීවනයක සලකුණක් හෝ දක්නට නොලැබුණේ මෙවැනි හේතු නිසාය. මහනුවර සමයේ බෞද්ධ පුනර්ජීවනයක සලකුණු පහළ වූයේ නායක්කර් වංශික රජෙකු වූ කීර්ති ශ්‍රී රාජසිංහ සමයේදීය. අතිපූජ්‍ය වැලිවිට සරණංකර ස්වාමීන් වහන්සේ ශාසන සේවාවන් ආරම්භ කළේ මෙම රජ සමයේදීය. උන්වහන්සේගේ අනුශාසනා මාර්ගෝපදේශකත්වය රජු අගය කරන ලදී. දෙවියන් උදෙසා දේව පෙරහැරක් ලෙස පැවැති පැරණි ඇසළ පෙරහැර ජාතික උත්සවයක් ලෙස ආරම්භ වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ සමයේදීය. පිරිහී තිබූ භික්ෂු ශාසනය නැවත ඇති කිරීම සඳහා උපසම්පදාව පිහිටුවීමට සියම් දේශයෙන් භික්ෂූන් වහන්සේලා වැඩම කරවන ලදී. උන්වහන්සේලා ඇසළ පෙරහර නරඹා එය දෙවියන් උදෙසා නොව දළදා වහන්සේ සඳහා විය යුතු බව රජුට කළ අනුශාසනය නිසා දළදා පෙරහැර ඇසළ පෙරහැරට එකතු වන්නට ඇතැයි විශ්වාස කෙරේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස මුලින්ම දළදා පෙරහැර ගමන් කිරීමත් දෙවනුව දේවාල පෙරහැර ගමන් කිරීමත් ආරම්භ විය.

පෙරහැර ඇසළ මාසයේ පවත්වන හෙයින් ඇසළ පෙරහැර වශයෙන් හඳුන්වනු ලැබේ.

ඇසළ පෙරහැර පිළිබඳ ප්‍රසිද්ධ මත දෙකක් පවතී. ඉන් පළමු මතය වන්නේ ඇසළ මස අමාවක දිනයේදී අවසන් වූ සුරාසර යුද්ධය ජයග්‍රහණය කිරීම සඳහා ඇසළ පෙරහැර ආරම්භ කළ බවය. ඇසළ පෙරහැර අවසානයේ දිය කැපීමෙන් පිළිබිඹු කරන්නේ සුරාසර යුද්ධයේ අසුරයන්ට මරු කැඳවූ කඩු සුරයන් විසින් සෝදා පවිත්‍ර කළ බව දැක්වෙන බව මෙම මතය දරන්නන් සනාථ කරති. දෙවන මතය වන්නේ ක්‍රි.ව. 110-113 සමයේදී සොලීන් විසින් ශ්‍රී ලංකාව ආක්‍රමණය කර රැගෙන ගිය 12000 ක් පමණ වන සිංහලයන් ගැන ඇසූ වංකනාතිස්ස රජුගේ පුත් ගජබා රජු සොලී දේශය ආක්‍රමණය කර සිංහල සිරකරුවන් මුදවාගෙන 24000 ක් වන සොලී ජනයා සිරකරුවන් ලෙසද, සොලීන් විසින් පැහැර ගත් පාත්‍රා ධාතුවද, පත්තිනි දේවාලයේ රන්සලඹද සොලීන්ගෙන් ආපසු රැගෙන විජයග්‍රාහීව පැමිණීම සමරනු වස් ඇසළ පෙරහැර ආරම්භ කළ බවය. මෙම මතය දරන්නන් තහවුරු කර සිටින්නේ ගජබා රජු සොලී දේශය ආක්‍රමණය කිරීමට නීල මහා යෝධයා සිය යගදාවෙන් ගසා මුහුදු දිය දෙබෑ කරවූ අයුරු පෙරහැර අවසානයේ සිදු කරන දිය කැපීම මගින් සංකේතවත් වන බවය.

ඇසළ උත්සවය විෂ්ණු දෙවියන්ගේ උත්පත්තිය සැමරීම සඳහා විෂ්ණු දෙවියන්ගේ පස මිතුරන් වූ අසුරයන් ජයගැනීම සිහිගැන්වීම සඳහා ඇසළ පෙරහැර ආරම්භ කළ බව තවත් මතයකි.

ඇසළ මාසය බෞද්ධයන්ට විශේෂ වූ මාසයකි. මහා බෝසතුන් මහාමායා දේවියගේ කුස පිළිසිඳ ගත්තේද, මහාභිනිෂ්ක්‍රමණය සිදුවූයේද බුදුරදුන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනය පැවැත්වූයේද ඇසළ පුර පසළොස්වක පෝය දිනයේදීය.

**ලයනල් විජේසුන්දර** - ලේකම්, විදේශ සබඳතා, ශ්‍රී දළදා මාලිගාව


"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."

යන එන සෑම තැන ජය ලබන්නත්
සියලු සැප අත් විඳින්නත්

# ඔබ කැමැති නම්

රළඟ අත් භවයේ නොව
මේ අත්භවයේදීම

# මහා මංගල සූත්‍රයේ එන මේ ඔවදන් පිළිපදින්න



අපේ බෞද්ධ පින්වතුන්ට වඩාත් හුරුපුරුදු මහ පිරිතට අයත් පළමුවන සූත්‍ර දේශනාව මහා මංගල සූත්‍රයයි. මේ සූත්‍ර දේශනාව පිරුවානා පොත් වහන්සේට සංග්‍රහ කොට තිබුණද මෙහි අන්තර්ගතව ඇත්තේ ලෞකික ලෝකෝත්තර වශයෙන් ජීවිතය ජයගන්නා ආකාරය අනුපිළිවෙළින් ඉදිරිපත් කොට ඇති සුන්දර ජීවන ප්‍රතිපදාවකි. එබැවින්ම බෞද්ධ ජීවිතයක් මංගල සූත්‍රයේ දැක්වෙන පියවරයන් ඔස්සේ ගොඩ නගතොත් පරමාදර්ශී බෞද්ධ සමාජයක් බිහිකර ගත හැකිය. මෙම සූත්‍ර දේශනාව සිදුකිරීමට බුදුන් වහන්සේට ආරාධනය කොට ඇත්තේ දෙවියකු වන මුත් එහි එන මංගල කරුණු මිනිස් සමාජය අරමුණු කරගෙන, බොහෝ කොටම ගිහි ජීවිත ගතකරන පින්වතුන්ගේ මෙලොව, පරලොව ජීවිත අර්ථවත් කරගන්නා ආකාරය පිළිබඳව ප්‍රකාශිතය.

සූත්‍රයේ දෙවන ගාථාවේ සිට සතරවන ගාථාව දක්වා අඩංගු කරුණු ජීවිතයේ මුලදීම ලැබිය යුතු හෝ අත්පත් කරගත යුතු කරුණුය.

1. අසත්පුරුෂයන් ආශ්‍රය නොකිරීම
2. සත්පුරුෂයන් සේවනය කිරීම
3. පිදිය යුත්තන් පිදීම
4. සුදුසු ප්‍රදේශයක වාසය කිරීම
5. පෙර පින් ඇති බව
6. සිත යහපතෙහි පිහිටුවා ගැනීම
7. බොහෝ ශාස්ත්‍ර හා ශිල්ප දැනීම
8. මනාව හික්මුණු, විනයගරුක බව
9. යහපත් වචන ඇති බව.

මහා මංගල සූත්‍රයේ දැක්වෙන මෙම කරුණු පුද්ගලයකු ගෘහ ජීවිතයට ඇතුළත් වීමට පෙර එනම් ළමා, තරුණ කාලයේදී අත්පත් කරගත යුතු කරුණුය. එහි මුලටම පෙන්වා ඇත්තේ අසත්පුරුෂ සේවනයෙන් දුරුවීමත්, සත්පුරුෂයන් ආශ්‍රය කිරීමත්ය. එමගින් ලෞකික, ලෝකෝත්තර දෙඅංශයේම අභිවෘද්ධියට කළ්‍යාණ මිත්‍ර සේවනයේ පවත්නා වැදගත්කම අවධාරණය කොට තිබේ.

පුද්ගලයෙක් තරුණ වියට එළඹිය යුත්තේ ඉහත සඳහන් කරුණුවලින් තාරුණ්‍යය හැකිතාක් පිරිපුන් කරගැනීමෙනි. තම ජීවිතයේ බර, පවුලේ බර, සාමාජීය, ජාතික, ආගමික වගකීම්

"දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී."





දුරිය හැක්කේ ශිල්ප ශාස්ත්‍ර ඥානයෙන්ද, විනයෙන්ද, පැහැදිලි දක්මකින්ද යුතු අයෙකුටය.

මංගල සූත්‍රයේ පස්වන ගාථාවේ සිට අටවන ගාථාව දක්වා දක්වෙන කරුණු තරුණ වියේ සිට ජීවිතයේ මධ්‍යම කාලය අවසන් වන තෙක් ඇතිකර ගත යුතු කරුණු සේ පෙනේ. ඒවා මෙසේය.

**මව්පියන්ට උපස්ථාන කිරීම, අඹු දරුවන්ට සංග්‍රහ කිරීම, නිවැරදි කර්මාන්තයන්හි යෙදීම, දන් දීම, දස කුසලයන්හි හැසිරීම, ඥාතීන්ට සංග්‍රහ කිරීම, නිවැරදි ක්‍රියා ඇති බව, පාපයෙහි නොඇලීම හා පවින් වැළකීම, කුසල ධර්මයන්හි අප්‍රමාදී බව, ගරු කළ යුත්තන්ට ගරු කිරීම, යටහත් පැවැතුම් ඇති බව, ලද දෙයින් සතුටු වීම, කෙළෙහි ගුණ සැලකීම, ධර්මශ්‍රවණය යනාදියයි.**

මෙම කරුණු ඔස්සේ පුද්ගලයා තම දෙමාපියන්ටත්, පවුලටත්, සමාජයටත් අර්ථ සම්පන්න අයෙක් වනවා සේම තමා ධර්මයෙහි පිහිටි තැනැත්තකුද වෙයි.

ජීවිතයේ ඒ ඒ කාලවලදී නිම කළ යුතු කටයුතු නිසි පරිදි ඉටු කිරීමෙන් පසුව ජීවිතයේ අවසන් කාලය තම ආත්ම විමුක්තිය පිළිබඳව සිතා වඩාත් ධර්මානුකූලව ගත කළ යුතුවේ. 9-11 දක්වා ගාථාවල අන්තර්ගත කරුණුවලින් ඒ බව මැනවින් පැහැදිලිය. **ඉවසීම, කීකරුකම, ශ්‍රමණයන් වහන්සේලා දැකීම, සුදුසු කාලයේ ධර්ම සාකච්ඡාව, බ්‍රහ්මචරියාව, චතුරාර්ය සත්‍යාවබෝධය** යන මේ කරුණු මනුෂ්‍ය ජීවිතයකින් ලද හැකි උත්තම ඵලය.

බොහෝ දෙනකුට වියපත් වන විට ඉවසීම, කීකරු බව, ඉන්ද්‍රිය දමනය ආදී කරුණු අත්පත් කරගැනීමට නොහැකිව තිබෙන බව පෙනේ. මංගල සූත්‍රයේ 11 වන ගාථාවෙන් මෙම ප්‍රතිපදාවේ යෙදීමෙන් පුද්ගලයකුට මේ ජීවිතයේදීම ලැබිය හැකි ප්‍රත්‍යක්ෂ ප්‍රායෝගික ප්‍රතිඵල රාශියක්ද ප්‍රකාශිතය. ඒවා නම්,

**අටලෝ දහමින් කම්පා නොවීම, ශෝක රහිතව විසිය හැකි බව, රාගාදී කෙලෙස් රහිත බව, බය රහිත බව යනාදියයි.**

සූත්‍රාවසානයේ දක්වෙන්නේ මේ කරුණු සාක්ෂාත් කළ අය සියලු තැන්හි නොපැරදුණ සියලු සැප ලද්ද වූ පුද්ගලයකු වන බවය. මේ අනුව මංගල සූත්‍රය පින්කමක් වන්නා සේම ප්‍රායෝගික බෞද්ධ ජීවන ප්‍රතිපදාවකි. අපේ බෞද්ධ සමාජය ලෞකික, ලෝකෝත්තර දෙඅංශයෙන්ම අර්ථ සම්පන්න පරමාදර්ශී සමාජයක් බවට පත්කරලීමට නම් දහම් පාසල් මට්ටමින් හෝ මේ සූත්‍රයේ ජීවන ප්‍රතිපදාව ක්‍රියාවට නැංවිය යුතුය. ලෞකික කටයුතුවල කෙතෙක් යෙදුණත් ජීවිතයේ තුන් කාලයේදීම ධර්මයෙහි පිහිටා ක්‍රියා කළ යුතු බව මේ සූත්‍රයෙන් අවධාරණය කර තිබේ.

**මල්වතු මහා විහාරවාසී පූජ්‍ය හෙම්මාතගම පියදස්සි හිමි**

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."



ධර්ම දේශනය

# කලණ මිතුරු ඇසුරෙන් ජීවිතය ජයගත හැකිය

දේශකයාණෝ ස්‍යාමෝපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ විංශද්වර්ගික ගරු කාරක සංඝසභික

පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ මේධංකර නේවාවහාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

න භජෙ පාපකෙ මිත්තෙ
න භජෙ පුරිසාධමෙ
භජෙථ මිත්තෙ කල්‍යාණෙ
භජෙථ පුරිසුත්තමෙ


පින්වත්නි,

ධම්මපදයේ පණ්ඩිත වග්ගයට අයත් මෙම ගාථා පාඨයෙන් දැක්වෙනුයේ "පව්ටු මිත්‍රයන් සේවනය නොකළ යුතුය. සැහැසිකම් හා පහත් අදහස් ඇති මිනිසුන් සේවනය නොකළ යුතුය. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කළ යුතුය. ශීලාදී ගුණ ධර්මයන්ගෙන් වැඩුණු උත්තම පුරුෂයන් ඇසුරු කළ යුතුය." යනුවෙනි.

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

ඡන්න තෙරුන් වහන්සේ අරභයා දේශනා කළ මෙම ගාථා ධර්මය, ඇසුරු කළ යුතු මිනිසුන් හඳුනාගැනීමට බෙහෙවින් උපකාරී වෙයි. සිදුහත් කුමරු උපන් දා ම උපත ලත් ඡන්න ඇමතියා සිදුහත් කුමරු මහභිනික්මන් කරන විට බෝසතාණන් වහන්සේ සමග ගමන් ගත් අසු මෙහෙයවූ සුවච සේවකයාය. ඔහු සිදුහත් කුමරු බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව පැවිදිව පෙර සේ කීකරුව සිටියේය. ඡන්න තුළ ගිහි කළ පැවති රළු පරළු ගතිගුණ පැවිදි වුව ද එසේම විය. ඔහු නිතර තමන් සමග සිදුහත් කුමරු ගිහිගෙය හැර දා බුදුබව පතා මහභිනික්මන් කිරීමට සහායව ගිය ගමන ගැන සිහිපත් කරමින් අගසව්වන් ඇතුළු අනෙක් ශ්‍රාවකයන් වහන්සේලා කෙරෙහි නිගරු වන සේ බස් දොඩමින් හැසිරීමට පටන් ගත්හ. මේ බව දත් බුදුරජාණන් වහන්සේ දිනෙක ඡන්න අමතා, දැගසව්වන් ඇතුළු අනෙක් ශ්‍රාවකයන් වහන්සේලාට දොස් පරොස් නොපමුණුවන ලෙස අවවාද කළ නමුත් ඔහු නොහික්මිණ. මෙසේ තෙවරක්ම අවවාද කළත් අනෙකුත් තෙරුන් වහන්සේලා කෙරෙහි ඔහුගේ ඇති නොහික්මුණුකම අත් නොහරින බව දැක, බුදුරාජාණන් වහන්සේ, මහණෙනි, මා වැඩසිටින තාක් කල් ඡන්න හික්මවාලිය නොහැකි බවට වදාළ සේක.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පානා දිනයෙහි ආනන්ද මහතෙරුන් වහන්සේ මෙම වචන සිහිකොට ඡන්න තෙරුන් කෙරෙහි පවතින ආකාරය විමසා සිටියහ. එවිට බුදුරජාණන් වහන්සේ ඡන්න තෙරුන් කෙරෙහි බ්‍රහ්මදණ්ඩය දිය යුතු බවට වදාළ සේක. බ්‍රහ්මදණ්ඩය නම් දොසක්, වරදක් දුටුව ද අවවාද කිරීමෙන් වැළකී කතා බහ නොකර හැරීමය. මේ දඬුවම කළ දවසෙහි ඡන්න තෙරුන් වහන්සේ "මා නැසුව මැනවැයි" කියා තුන්වරක්ම සිහිසුන් නැතිව මෙම දඬුවමින් කීකරු බවට පත්වූහ. ඒ දඬුවමින් කීකරු බවට පත් වූ ඡන්න තෙරුන් වහන්සේ පසුව රහත් ඵලයට ද පැමිණියහ. මෙම කරුණ නිමිති කොට ඉහත ගාථා පාඨය වදාළ සේක.



මිනිසාගේ පෞරුෂ සංවර්ධනය හා සදාචාර ජීවනය කෙරෙහි කල්‍යාණ මිත්‍ර ආශ්‍රය කොපමණ වැදගත් වන්නේ දැයි මෙම ගාථා පාඨයෙන් අනාවරණය වේ. යමෙක් සතුටේ දී සතුටු වේ නම් ඒ කලණ මිතුරාගේ ස්වභාවයයි. එමෙන්ම කරදරයක දී ආරක්ෂාව සැලසීම ද එබඳු මිත්‍රයාගේ සිරිතයි. එක් අතකින් මිත්‍රත්වය යනු මෛත්‍රියයි. ඔවුනොවුන් කෙරෙහි ප්‍රියමනාප ඇසින් බලමින්, සුහද සංවාද කරමින් මිත්‍රත්වයෙන් කටයුතු කළ යුතු බව බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට අනුදැන වදාළ සේක.


එසේම ඔවුනොවුන් හා සහයෝගයෙන්, සහජීවනයෙන්, යහපත් ආකල්පයෙන් ඇසුරු කිරීම කල්‍යාණ මිත්‍ර ඇසුරේ ස්වභාවයයි. කල්‍යාණ මිත්‍රයෙකුට තම මිතුරා වෙනුවෙන් කාලයෙන්, ශ්‍රමයෙන්, ධනයෙන් සෑම අතින්ම ඕනෑම දෙයක් හැකි උපරිමයෙන් හෘදයාංගම ලෙස උපකාර කිරීම සිරිතයි. ඔහුට මිතුරා වෙනුවෙන් නොඉවසිය හැකි වේදනාවක් හෝ කරදරයක් නොමැති තරම්ය. කල්‍යාණ මිත්‍ර ඇසුරක් ඇති තැනැත්තාට ජීවිතයේ ඕනෑම කරදරයක්, දුක් පීඩාවක් විඳ දරා ගැනීමට පහසු වන්නේය. මානසික පීඩනයක දී වැටීමක දී තම පෞරුෂත්වය යළි ගොඩනගා ගැනීමට කල්‍යාණ මිත්‍රයෙකුගෙන් ලැබෙන සහය බෙහෙවින් අගය කළ යුත්තකි.

ජීවිතයේ අර්ථ, ධම්ම, නිරුක්ති, පටිසම්භිධා යන සිවුපිළිසිඹියාපත් ලබා ගැනීමේ පදනම ද කල්‍යාණ මිත්‍ර ඇසුරයි. කල්‍යාණ මිත්‍ර ඇසුරක්

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."

ඇති තැනැත්තා සතුරන් නැති කමින් සතුට විඳියි. එනිසාම සුව සේ නිදා ගනියි. සුව සේ අවදි වෙයි. නපුරු සිහින නොදකියි. කාටත් ප්‍රියමනාප වෙයි. දෙවියන්ගේ ද පිහිට ලැබෙයි. මෛත්‍රී සිත් ඇති තැනැත්තාට කවරකින් හෝ පීඩාවක් හිරිහැරයක් සිදු නොවෙයි. ප්‍රසන්න වෙයි. සිහියෙන් කලුරිය කළ හැකිය.

කල්‍යාණ මිත්‍ර ඇසුරක් ඇති තැනැත්තා සිල්වත්, ත්‍යාගශීලී ගුණගරුක නුවණැති පුද්ගලයෙක් බවට පත් වෙයි. පුද්ගලයාගේ දියුණුව පිණිස කල්‍යාණ මිත්‍ර ඇසුර ඉතා වැදගත් වේ. දුටු තරමින් හෝ කතාබස් කළ පමණින් යමෙකු හොඳ තැනැත්තෙකැයි සිතා ඇසුරට නොගත යුත්තේ පිටින් පෙන්වන ගුණ ඇතුළතින් දක්නට නොලැබෙන බැවිනි. ලෝහ කාසියක් රනින් ඔපවත් කළාක් වැනි රැවටිලිකාරයන් ද අප සමාජයේ ජීවත් වේ. මිතුරෙකු සොයාගත යුත්තේ නුවණින් පරීක්ෂා කර බැලීමෙනි.



දිනක් ආනන්ද හිමියන්, බුදුසසුනෙන් ලැබෙන දියුණුවෙන් අඩක් පමණ කල්‍යාණ මිත්‍ර සම්පත්තියෙන් ලැබෙනවා යැයි කී විට, බුදුරජාණන් වහන්සේ, බුදුසසුනෙන් ලැබෙන දියුණුවෙන් අඩක් නොව මුළු දියුණුවම සැලසෙන්නේ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය නිසා යැයි වදාළ සේක. ඕනෑම කෙනෙකුට ඇසුරට මිතුරෙකු අවශ්‍යමය. "මාතා මිත්තං සකෙ සරෙ" යනුවෙන් කුඩා වියේ දී ඇසුරු කළ යුතු මිත්‍රයා ගුණ නුවණ ඇති මෑණියෝ බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක. මේ බව මැනවින් තේරුම් ගෙන කටයුතු කිරීම මවුපියන්ගේ ද යුතුකමක් වන්නේය. මේ තුළින් යහපත් දරුවෙක් සමාජයට දායාද කිරීමට බෙහෙවින් උපකාරී වේ. විවාහ දිවියට පිවිසි විට අඹුසැමියෝ ගුණ සම්පන්න නම් ඔවුනොවුන්ට මිතුරු වෙති. නිවසේ දී මෙන්ම නිවසින් බැහැර වූ විට ද කලණ මිතුරු ඇසුරට සුදුසු අය තෝරා ගැනීම සමාජයේ යහපතට හේතු වෙයි.

පව්ටු අධම අසත්පුරුෂයන්ගේ ඇසුරට එක් වුව හොත් මුළු ජීවිතයම විනාශ වීමට පුළුවන. පාපමිත්‍රයෝ ඇසුර නිසා පිරිහී සිඟමනට වැටුණු ජීවිත ද නැතුවා නොවේ. සෝවාන් වීමට පුණ්‍ය බල මහිමය තිබූ අජාසත් රජු පිරිහී නිරයට ගියේ පාපමිත්‍ර ඇසුර නිසාය.

පව්ටු මිත්‍රයන් ඇසුරට ලැබුණොත් හැම අතින්ම පිරිහීමක් ඇති වෙයි. සුරාවට, සූදුවට මෙන්ම සල්ලාලයින් ආශ්‍රය තුළින් ද පුද්ගලයා විනාශයට පත් වේ. පාප මිත්‍රයන් ආශ්‍රයෙන් තොර වූ විට පුද්ගලයාගේ දෙලොවම දියුණුව ළඟා කර ගත හැකිය.

පව්ටු අසත්පුරුෂ මිතුරන් සතර දෙනෙකි. හිතවත්කමක් නොමැතිව යමක් ලබා ගැනීමේ චේතනාවෙන් පමණක් මිතුරුකම් පවත්වන මිත්‍රයා, පුහු වචනවලින් පමණක් සංග්‍රහ කරන මිත්‍රයා, මිත්‍රයා සතුටු කිරීමට පමණක් සිතන කියන මිත්‍රයා, දියුණුව නැති කරන මිත්‍රයා යනු ඒ පව්ටු මිතුරන් සතර දෙනායි.

කල්‍යාණ මිත්‍රයෝ ද සතරදෙනෙකි. උපකාරක මිත්‍රයා, සමාන සුඛදුක්ඛ මිත්‍රයා, අත්ථක්ඛායී මිත්‍රයා, අනුකම්පක මිත්‍රයා යනුවෙනි. දුක සැප දෙකෙහි සමසේ උදවු කරන්නේ උපකාරක මිත්‍රයායි. සැපේ දී හා දුකේ දී වෙනසක් නැතිව පවතින්නේ සමාන සුඛ දුක්ඛ මිත්‍රයායි. දියුණු වන හැටි කියා දෙන්නේ අත්ථක්ඛායී මිත්‍රයායි. මවක් දරුවෙකුට දක්වන අනුකම්පාව මෙන් අනුකම්පා කරන්නේ අනුකම්පක මිත්‍රයායි.

අංගුත්තර නිකායට අයත් මිත්‍ර සූත්‍රයේ සඳහන් ආකාරයට කරුණු සතකින් සමන්විත මිත්‍රයෝ සේවනය කළ යුතුය. දෙන්නට දුෂ්කර වූ දෙයම දෙන, දුෂ්කර වූ දැයම කරන, නොඉවසිය හැකි දෑ ඉවසන, තමාගේ රහස් මිතුරාට පළ කරන, ඒ මිතුරාගේ රහස් සඟවන, ආපදාවක දී මිතුරා අත් නොහරින, ධන හානියක දී ඔහුට අවමන් නොකරන යන මේ කරුණු හතින් සමන්විත මිත්‍රයන් සේවනය කළ යුතු බව මිත්‍ර සූත්‍රයේ දේශනා කොට ඇත. අපිදු මිතුරන් ඇසුරු කිරීමේ දී යහපත් ගුණ නුවණින් හෙබි සත්පුරුෂ කලණ මිතුරන්ම සේවනය කිරීමට වෑයම් කරමු. තෙරුවන් සරණයි.

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''

# ඔබට නින්ද යන්නේ නැද්ද

# නපුරු සිහින පෙනෙනවාද?





## හොඳම ඔසුව මෛත්‍රී භාවනාවයි

මෛත්‍රී භාවනාවේ යෙදෙන යෝගාවචරයාට ලැබෙන අනුසස් එකොළසකි. එයින් දහයක්ම මේ ජීවිතය තුළදීම අත්විඳිය හැකියි. එකොළොස් වැනි ආනිශංසය වුවද මේ ජීවිතය තුළම ලබා ගත හැකි නිවනයි. බඹලොව උපදිනු ලබන්නේ නිවන ලබා ගත නොහැකි වූ විට පමණි. එසේ වුවහොත් එය පරලොවදී ලබන ආනිශංසයකි.

**සුඛං සුපති**

සුව සේ නිදයි. ඇතැම් කෙනෙක් ඔබ මොබ පෙරළෙමින් 'සුරු සුරු' ගාමින් දුකසේ නිදති. මේ යෝගී එසේ නොවැ සුවසේ නිද නිදන්නේත් සමවතකට සම වැදුණා සේ නිදයි.

**සුඛං පටිබුජ්ඣති**

සුවසේ පුබුදී. ඇතැම් කෙනෙක් තතනමින් හැඹෙමින් පෙරළෙමින් දුකසේ පුබුදිති. මේ යෝගී එසේ නොවැ පිපී ගෙනැ එන පියුමක් සේ නිර්විකාර වැ සුවසේ පුබුදියි.

**න පාපකං සුපිනං පස්සති**

නපුරු සිහින නොදකී. සිහිනයක් දක්නේ නම් සෑ වඳනා පුදනා සේ බණ අසන සේ යහපත් සිහිනයක්ම දක්නේය. තවද ඇතැම් කෙනෙක් සොරුන් විසින් පිරිවරන ලද සේ චණ්ඩ සතුන් විසින් ලුහුබඳින ලද සේ ප්‍රපාතයෙහි වැටුණවුන් සේ සිහින දකිති. මේ යෝගී එබඳු සිහින නොදකී.

**මනුස්සානං පියෝ හෝති**

මිනිස්සුන්ට ප්‍රිය වෙයි. උරෙහි ලූ මුතු හරක් සේද, හිස පැළඳි මල් මාලාවක් සේද, මිනිසුනට ප්‍රියමනාප වෙයි.

**අමනුස්සානං පියෝ හෝති**

විසාඛ තෙරණුවන් මෙන් අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි.

**දෙවතා රක්ඛන්ති**

මෑණි කෙනෙක් පුතෙකු මෙන් දෙවියෝ රකිත්.

**නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා ඛමති**

මෙත් වඩන යෝගීහුගේ සිරුරෙහි උත්තරා උපාසිකාවගේ සිරුරෙහි මෙන් ගිනි නොගනී. සංයුක්ත භාණක චූල්ලසීව තෙරුන්ට මෙන් විස නො කැවේ. සංකිච්ච සාමණේරයන්ට මෙන් සැත් නොවදී. මෙහිලා ධෙනු වස්තුවද කිය යුතු.

එක් ගව දෙනෙක් වසුට කිරි දෙමින් සිටියාය. වැද්දෙක් ඇය දක විදිමියි සිතා අතින් සරහා පියා දිග මිට ඇති තෙබින් ඇන්නේය. තෙබ දෙනගේ සිරුරේ වැදූ තල් කොළයක් මෙන් වකුටු විය. ඒ කලි උපචාර බලයෙකින් වූයේ නොවේ. අපර්ණා බලයකින් වූයේ නොවේ. හුදෙක් වසු කෙරෙහි පැවැති දැඩි ප්‍රිය සිත් බලයෙන් වූයේ. මෛත්‍රිය මේ සා මහානුභාව ඇතැයි දත යුතු.

**තුවටං චිත්තං සමාධියති**

මෙත් වඩන්නහුගේ සිත වහා සමාහිත වේ. එහි ලැසි බවෙක් නම් නොවේ.

**මුඛවණ්ණෝ විප්පසිදති**

නැටිටෙන් ගිලිහුණු තල් ගෙඩියක් සේ ඔහුගේ මුහුණ ඉතා පහන් වේ.

**අසම්මුල්හෝ කාලං කරෝති**

මෙත් වඩන්නාහුට සිහි මුළා වැ වන මරණයක් නැති. නුමුළාවම නිදි ගත්තා සේ කලුරිය කෙරේ.

**උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලෝකූපගෝ හෝති**

ඉදින් රහත් වැ ගන්නට නොහැකි වී නම් නිද පිබිදියා සේ ගොස් බඹ ලොව උපදින්නේය.


(සිංහල විශුද්ධි මාර්ගය, පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංස ස්ථවිර පි. 452)

මහණෙනි, යම් භික්ෂු නමක් ඇසුරු සැණක් පමණ කාලය තුළ වුවද මෛත්‍රී සිත වඩයිද හෙතෙමේම භික්ෂුවක් වෙයි. ඔහුගේ භාවනාව ප්‍රතිඵල සහිත නොවන්නේ නොවේ.

හෙතෙම ශාස්තෘවරයාගේ අනුශාසනය පිළිපදින්නෙක් වෙයි. හෙතෙම මනා ඔවදන් පිළිපදින්නෙකි. එසේම හෙතෙම අනුන් විසින් සැදැහැයෙන් දෙන දනය පිළිගැනීමට සුදුස්සෙක් වෙයි.

**පූජ්‍ය කන්දරපංගුවේ ධම්මසිරි හිමි**

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහ් හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."



# බුදුන් දෙසූ ධර්මය අතුරුදන් වන කාලය කවදාද?

උතුම් බුදුරජාණන් වහන්සේලා මේ තුන් ලෝකයට ඉතා කලාතුරකින් පහළ වෙලා දේශනා කරන ධර්මය නම්, චතුරාර්ය සත්‍ය ධර්මයයි. නුවණැති දෙවි මිනිසුන් ඒ උතුම් ශ්‍රී සද්ධර්මය හොඳින් අසා දරාගෙන ඒ උතුම් ශ්‍රී සද්ධර්මය තමාගේ නුවණින් විමසා මේ භයානක වූ සංසාර දුක ඒ තුළින් අවබෝධ කරගෙන, බුදු සසුනක පමණක්ම ලැබිය හැකි ඒ සුන්දර වූ නිවන පසක් කරනු ලබනවා.

පින්වතුනි, මේ චකවානුවේ ඉතා ස්වල්ප පිරිසක්, ධර්මය ශ්‍රවණය කිරීමත්, ධර්මයේ හැසිරෙන අයුරුත් දකින්නට ලැබෙනවා. සමස්ත මනුෂ්‍යයන්ගේ ප්‍රමාණය දෙස බලද්දී එය ඉතා ස්වල්පයක්.

අවිද්‍යාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු සත්ත්වයාට සංසාර දුකින් මිදීමට නම් තථාගත වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසින් අවබෝධයෙන්ම දේශනා කරනු ලබන උතුම් ශ්‍රී සද්ධර්මය ලෝකයේ ඉතා පිරිසිදුව තිබිය යුතුයි. පින්වතුනි, බුදුරජාණන් වහන්සේ වදාළ උතුම් දෙසුමක් ගැන අප විමසා බලමු.

මෙයින් කියවෙන්නේ ධර්මය රටක, ලෝකයේ අතුරුදන් වීමට හේතුවන කාරණා ගැනයි. මෙය සඳහන් වන්නේ සං.නි. 1 වන පොත් වහන්සේගේ කස්සප සංයුක්තයේ එන පළවන වර්ගයේ 13 සූත්‍රය වූ "සද්ධම්ම පතිරූපක" සූත්‍රයේදී මේ කරුණු උන්වහන්සේ කස්සප ස්වාමීන් වහන්සේට දේශනා කළා.

"පින්වත් කස්සපය, යම්තාක් කල් ධර්මය හදමින්, නිර්මාණය කරමින් කියන්නෙක් පහළ නොවේද, ඒ තාක් කල් ධර්මය අතුරුදන් නොවේ. යම් කලෙක ධර්මය නිර්මාණය කරයිද, එවැන්නෙක් පහළ වේද, එවිට සද්ධර්මය අතුරුදන් වේ.

(පින්වත් කස්සපය, එය මෙබඳුය.) ලෝකයේ යම්තාක් කල් රන් හා සමාන දෙයක් පහළ නොවේද, ඒ තාක් කල් රන් අතුරුදන් නොවේ. යම් කලෙක රන් හා සමාන දෙයක් උපදීද, එකල රන් අතුරුදන් වේ.

මේ අයුරින්ම... මාගේ ධර්මයට වන්නේය.

පින්වත් කස්සපය... මේ පඨවි ධාතුව, ආපෝ ධාතුව, තේජෝ ධාතුව, වායෝ ධාතුව යන ධාතූන් සද්ධර්මය අතුරුදන් නොකරයි. නමුත් සද්ධර්මය අතුරුදන් කරන (මෝඝ) හිස් පුරුෂයෝ මේ ශාසනයෙහිම පහළ වෙනවා.

කස්සපය, යම් සේ නැවත බඩු වැඩිවී නැව ගිලේද, ඒ අයුරින් මේ සද්ධර්මය අතුරුදන් නොවේ. (මෙයින් අදහස් කරන්නේ පැවිදි ශ්‍රාවකයන්, පැවිදි ශ්‍රාවිකාවියන්, ගිහි ශ්‍රාවකයන්, ගිහි ශ්‍රාවිකාවියන් කොතෙක් ලෝකයේ වැඩි වුවද බුදු සසුන නොපිරිහෙන බවයි.)

පින්වත් කස්සපය, සද්ධර්මය අතුරුදන් වීමට හේතුවන කරුණු පහකි. එනම්, බුදුරජාණන් වහන්සේ ගැනද, ශ්‍රී සද්ධර්මය ගැනද, ආර්ය මහා සඟරුවන ගැනද, සීලය ගැනද, සමාධිය ගැනද යන කරුණු පස ගැන ගෞරවයක්, යටහත් බව නැත්තේද, එවිට ධර්මය අතුරුදන් වේ. සිවුවනක් පිරිස මේ කරුණු පහ ගැන ගෞරවය, යටහත් පැවැතුම් නැති නම්, ශ්‍රී සද්ධර්මය අතුරුදන් වේ.

පින්වත් කස්සපය, ශ්‍රී සද්ධර්මය අතුරුදන් නොවීමට නම් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවනක් පිරිසම බුදුරජාණන් වහන්සේට, ශ්‍රී සද්ධර්මය, ආර්ය මහා සඟරුවන, ශීලය, සමාධිය යන කරුණු පස ගැන ගෞරවය, යටහත් බව දැක්විය යුතුය.

දැන් බොහෝ තැන්වල ඔබට දකින්නට ලැබෙන්නේ බුදු දහමේ නාමයෙන් වැජඹෙන බමුණු දහමකි. මේ කියූ දෙය මෙවැනි උපමාවකින් වුවද, ඉතා පහසුවෙන් වටහා ගත හැකියි.

පින්වතුනි, බෝගසක් පුරා, ඒ මත වැඩුණු පිළිල ශාකයන් ඔබද දැක ඇතැයි මා සිතනවා. බෝගසේම හැදී, එයම උපකාර කරගෙන, එහිම යුෂවලින් හොඳින් පෝෂණය වන පිළිල ශාකයක් මෙන්,

බෞද්ධ භික්ෂූන් අතර, බෞද්ධ යැයි සම්මත මිනිසුන් අතර ඉතා උසස් අයුරින් බමුණු දම වැජඹෙන ආකාරය, බුදු මග තුළ දිවි ගෙවන අපට නම් ඉතා පැහැදිලියි. වර්තමානයේ මෙය කතා කිරීම පවා ඉතා අර්බුදකාරී කරුණකි.

අප බෞද්ධයන් හැටියට විශේෂයෙන් සැලකිය යුතු කරුණක් තමයි ඔබට ධර්මය අවශ්‍ය නම්, ඉතා පිරිසිදු, නිර්මල ශ්‍රී සද්ධර්මය ත්‍රිපිටක බුද්ධ ජයන්ති පොත් වහන්සේලා පරිශීලනය කිරීමෙන් ලබාගන්න පුළුවන්.

මේ සංසාර ගමනේ ආරම්භය කවදා, කොහේදී ආරම්භ වී දැයි බුදු ඇසට පවා නොපෙනෙන තරම් දීර්ඝ යැයි බුදුරජාණන් වහන්සේ අපට වදාළේ... "අනමතග්ගායං භික්ඛවෙ සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති" යනුවෙනි.

මේ ආකාරයට බුදුරජාණන් වහන්සේ වදාළ, මේ දීර්ඝ සංසාර දුකින් නිදහස් වීම, අප හිතන තරම් පහසු කරුණක් නොවේ.

මේ සංසාර දුකින් නිදහස් වෙන්න නම්, මුලින්ම අප තුළ ඇති කර ගත යුතු කරුණු පහකි. එනම්, "සද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා" යනු එම කරුණු පහයි. මේවා තමයි පඤ්චසේඛ බල ධර්ම.

(මෙහි "සද්ධා" යනු අවබෝධයෙන් යුතුව තෙරුවන් සරණ යෑමයි.) පින්වතුනි, මේ සද්ධාව ආකාර දෙකක් තියෙනවා. පළමු වැන්න තමයි අමූලිකා සද්ධාව. දෙවැන්න නම් ආකාරවතී සද්ධාව. "සද්ධා" යන වචනයේ සාමාන්‍ය අර්ථය "පැහැදීම" යනුයි. අමූලිකා සද්ධා කියන්නේ මුලක් නැති පැහැදීමයි. ගසක මුලක් නැති නම් හෝ තිබූ මුල් දිරා ගිය විට ගස බිම වැටේ. මේ ආකාරයෙන්ම සමහර විට ඔබ දැක ඇති, සමහර බෞද්ධ කියා සිටි අය ටකරන් තහඩු ටිකක් නිසා, වැසිකිළියක් වෙනුවෙන්, කිරිපිටි වෙනුවෙන්, බුදු දහමට පිටුපා වෙනත් ආගම්වලට හැරෙන මිනිස්සු. මෙන්න මේ අයට තමයි "අමූලිකා සද්ධා" කියන්නේ.

එම සද්ධාව කෙසෙල් පරඬැල් වගෙයි. සුළං හමන හමන අතට හැරෙනවා. මේ සද්ධාව තමයි ලංකාවේ බෞද්ධයන් වැඩි පිරිසකට තියෙන්නේ. ඒ අයගෙන් තමයි බුදු සසුන පිරිහෙන්නේ. පැවිදි වී සිටින අය අතරෙත් මේ පරඬැල් සද්ධාව ඇති අය බොහෝ සිටිනවා. ඒ අය පහසුවෙන් හඳුනා ගන්න පුළුවනි. ඒ අය ග්‍රහ පූජා, සෙත්කවි, වස්කවි, සල්පිල් ආදී නොයෙක් මිත්‍යා වැඩවල යෙදී වාසය කරනවා. ඔවුන් ඒවා භික්ෂූන්ට සුදුසු නැති බවවත් දන්නේ නෑ.

ආකාරවතී සද්ධාවයි කෙනකු තුළ ඇති කරගන්න අමාරු. එය ඇතිකර ගැනීමට ඉතා තියුණු වූ නුවණක් තමා තුළ තිබිය යුතුයි. ලෝකයේ බොහෝ දෙනෙක් උගත්කම යනු නුවණ, ප්‍රඥාව යැයි සිතා සිටිනවා. එය ඉතා පැහැදිලිව මා දුටු අවස්ථාවක් තිබෙනවා. ඒ තමයි, ඔය උගන්වන ආයතනවල පුවරු සවි කරලා තියෙනවා. "පඤ්ඤා නරානං රතනං", උගත්කම මිනිසාට රත්නයකි. මෙය තනිකම බුද්ධ වචනය විකෘති කිරීමකි.

පින්වතුනි, උගත්තු උපාධිය නිසාම, ලෝකයේ බොහෝ පිරිසක් තමාවත් නොදැන අපාගත වෙති. එයට හේතුව, මානයෙන් මත්ව, ප්‍රාණ ඝාත, සොරකම්, වැරදි කාම සේවනය, බොරු කීම, මත්ද්‍රව්‍ය භාවිතය ආදියයි.



අද සිටින බොහෝ උගතුන් බුද්ධ වචනයට අකමැතිය. එය ඔබම නුවණින් අත්දකින්න බලන්න. ඔබ අසා තිබෙනවාද මේ බුදු වදන. "පඤ්ඤාවන්තාස්සායං ධම්මෝ නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස", මාගේ මේ ධර්මය නුවණැත්තන්ට මිස අනුවණයන්ට නොවෙයි.

මෙහි නුවණ යනු (පඤ්ඤා) පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳ වූ නුවණයි. ආර්ය වූ කළකිරීම ඇති කරවන නුවණයි. "උදයත්ථග ාමිණියා පඤ්ඤාය සමන්නාගතෝ, අරියාය නිබ්බේධිකාය සම්මා දුක්ඛක්ඛය ගාමිණියා", හටගැනීම නැතිවීම පිළිබඳව නුවණ තුළින් (අනිත්‍ය වූ සංස්කාරයන් පිළිබඳව) කලකිරීම ඇතිකර ගැනීමට ඇති හැකියාවයි. තවත් විදිහකින් කීවොත් මේ ලෝකයේ පවතින යථාර්ථය පිළිබඳව ඇති අවබෝධයෙන් යුතු කලකිරීමයි.

පින්වතුනි, සද්ධාවේ ඉහළම තලය තමයි අරහත්වය කියන්නේ. පින්වතුනි, එහෙම නම් අප තාමත් මේ සංසාරේ සැරිසරන්න හේතුව කුමක්ද යන්න ඔබට මේ තුළින් වටහාගත හැකියි නේද? එනම් බුදුරජාණන් වහන්සේ ගැන, ශ්‍රී සද්ධර්මය ගැන, ආර්ය මහා සංඝරත්නය ගැන, අවබෝධයෙන් යුතු (ආකාරවතී) සද්ධාව නොමැතිවීම නේද. එහෙම නම් අප තෙරුවන් ගැන සද්ධාව ඉතා ඉක්මනින්ම ඇතිකර ගත යුතුයි.

"ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත."

ඊළඟට සීලය.

සීලය තමයි නිවනට සම්පූර්ණයෙන්ම මාර්ගය සලසා දෙන්නේ. පින්වතුනි මේවා දවස් ගණන් සාකච්ඡා කළ යුතු ඒවා. මේ සීලය ගැන හොඳ අවබෝධයක් අප තුළ තිබිය යුතුයි. ගිහි පින්වතුන් තමාගේ නිත්‍ය සීලය ගැන, සාමණේර භික්ෂූන් තමාගේ සීලය ගැන, උපසම්පදා භික්ෂූන් වහන්සේලා තමාට අයත් සීලය ගැන ඉතා පුළුල් අවබෝධයක් ඇතිව වාසය කළ යුතුමයි. එසේ නොවුවහොත් ඒ සියල්ලෝම නාමික බෞද්ධ යන ගොඩටයි අයිති වන්නේ.

වර්තමානයේදී දේශපාලන කටයුතු, පාසල්, දහම් පාසල් කටයුතු, උත්සව ආදිය ආරම්භයේදී, පන්සිල් සමාදන් වන බවත් ඔබ දනී. එය චාරිත්‍රයකි. එහෙත් පන්සිල් ආරක්ෂා කරන කෙනකු මේ කියූ පිරිස අතරේ ඉන්නේ (කී දෙනෙකු) දැයි ඔබම විමසා බලන්න. පින්වතුනි, සිල් ආරක්ෂා කිරීම තමන් කැමැති වන්නා වූ සුගතියටද මාර්ගයයි.

පඤ්ච සේඛ බල වල ඊළඟ කරුණ "සුත" යයි.

සුත යනු බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය පිළිබඳව ඇති දහම් දැනුමයි. මේ ලෝකයේ මේ තරම් ප්‍රශ්න, ගැටලු ඇතිවීමට හේතුව කුමක්ද පින්වතුනි. බුදුරජාණන් වහන්සේගේ උතුම් ධර්මය ගැන කිසිම දැනීමක්, දරා ගැනීමක් නැතිකමයි. තථාගත ශ්‍රී සද්ධර්මය යම් කෙනෙකු අසා දරාගෙන, ඒ අනුවම ජීවිතය සකසා ගනී නම් ඒ ජීවිතය ලෝකයේ ඇති අති උත්තම ජීවිතයක් බවට පත්වීම, තථාගත ශ්‍රී සද්ධර්මයේ ඇති විශේෂත්වයයි.

අප මේ ඉගෙන ගනිමින් සිටින කරුණු කීයක් ඔබ ළඟ හා ඔබ ඇසුරු කරන පින්වතුන් අතර තිබේදැයි කියා විමසා බලන්න. එවිට ඔබට වැටහේවි, අනේ මේ කියන කරුණු ජීවිතයක දකින්න තිබුණා නම් කොපමණ අගේද කියා.

වර්තමානයේ ඔබට ඕන තරම් නිවැරදි වූ, පාරිශුද්ධ වූ බුද්ධ වචනය අහන්න ලැබෙනවා. ඔබ කල්පනා කරන්න ඒ ධර්මය කොතරම් ප්‍රමාණයක් ඔබගේ සවන්පත්වලින් ශ්‍රවණය කර තිබේද කියා. එවිට ඔබ ගැනම ඔබට දුකක් ඇතිවේවි.

අප කොයිතරම් සල්ලි හම්බ කර රැස් කළත් ඉඩකඩම්, යානවාහන, ගේ දොර ඉඩකඩම්, හම්බ කර රැස් කළත් ඒ සියල්ලම අපට තාවකාලික සැපක්, සතුටක් ලබාදී බොහෝ වූ දුක් වේදනා ලබාදී දුකටම පත් කරයි.

යමෙකු මේ කියූ සම්පත් සමග වාසය කරමින්ම ධර්මය ජීවිතයට පුරුදු කළොත් අප සැප විඳින ඒ බාහිර වස්තු අපට අහිමි වුවහොත් ඒ මොහොතේදී ඔහුට, අන් අයට මෙන් දුක ඇතිවීම සිදුවන දෙයක් නොවේ. ඒ කුමක් නිසාද, ඔහු ඒ සියල්ලෙහි ස්වභාවය ධර්මය තුළින් හොඳින්ම අවබෝධ කරගෙන සිටීමයි.

එසේනම් ඔබද වස්තුව, දේපළ රැස් කරන ගමන් ඒ අතරට අනිවාර්යයෙන්ම ධර්මය එකතු කරගෙන, ඒ ධර්මයට අනුව ජීවිතයම පුරුදු කරන්නම හිතන්න.

හතරවන කරුණ තමයි "චාග".

චාග කියන්නේ අත්හැරීම කියන එකයි. දැන් බලන්න ඔබ දැකලා ඇති තෑගි දීම. එහිදී දෙන දෙය දෙන්නේ ආපසු ගන්නා අදහසින් නොවේ. අපේ ඇස, කණ, නාසය, දිව, කය, මනස, අප මරණයේදී අත්හරිනවා. මේ කිවූ ආයතන හය අප සිතාගෙන සිටින්නේ මම, මගේ කියාය. ඒවා "මම" නම් "මගෙ" නම් ඒවා මට අහිමි විය නොහැකියි නේද? මගේ නොවන නිසා තමයි මේවා සියල්ලම යම් දිනෙක අපට අහිමි වන්නේ. ඒක නිසා පින්වතුනි අපි අපට තිබෙන බාහිර දේවල්ද දන් දෙමින් අපගේ අභ්‍යන්තර ආයතන කෙරෙහි ඇති ඡන්ද රාගය දුරුකර මේ සසරට පමුණුවන රූපය කෙරෙහි, ශබ්දය කෙරෙහි, ගන්ධ, රස, ස්පර්ශ, අරමුණු කෙරෙහි ඇති ඡන්ද රාගය දුරුකර සංසාර දුක ජය ගැනීමට උත්සාහ කරන්න ඕන.

පඤ්ඤා යන කරුණ තමයි පස්වෙනි කරුණ. පින්වතුනි ඔබට මතක ඇති මේ කරුණ මා ඔබට මෙහි මුලදීම සද්ධාව පිළිබඳ විග්‍රහයේදී විස්තර කර දුන්න ආකාරය. මේ පඤ්ච සේඛ බල, මෙවන් අවස්ථාවක ඉතා විස්තර සහිතව පහදා දීමට අවස්ථාව නොවේ. සද්ධාවෙන් පටන් ගන්නා මේ නිවන් මාර්ගය අවසන් වන්නේ ප්‍රඥාවෙන් බව දැන් ඔබට ඉතා හොඳින් වැටහෙනු ඇතැයි සිතමි.

පින්වතුනි, "නිවන් මගෙහි නික්මෙන" යන අදහසිනුයි මේවාට සේඛබල කියා කියන්නේ. "සේඛ" පුද්ගලයන් පස් දෙනෙකුද, "අසේඛ" පුද්ගලයන් එක්කෙනෙකුද වශයෙන් බුදුරජාණන් වහන්සේ ලෝකයාට පෙන්වා දුන් සේක. එනිසා ඔබ සියලු දෙනාටද අමාමහ නිවන් අවබෝධ කරගැනීම පිණිස පවතින, මේ "පඤ්ච සේඛ බල ධර්ම" තමා තුළ ඇති කරගෙන උතුම් වූ අමාමහ නිවන් අවබෝධ කරගැනීමේ භාග්‍යය මේ බුදු සසුනේම උදාවේවා.

පූජ්‍ය යටමලගල සුමනසාර හිමි



"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."



# නියත විවරණ ලබන්නේ කොහොමද?

මතු අනාගතයේදී නියත වශයෙන්ම සම්මා සම්බුදු පදවියට පත්වන බව සම්බුදුවරයකුගේ මුවින්ම ප්‍රකාශ කිරීම "නියත විවරණ" ලැබීම නම වේ. එසේ නියත විවරණ ලැබීමෙන් අනතුරුව සම්බුදු පදවියට පත්වන තාක් පෙරුම් පිරිය යුතු කාලසීමාව මත සියලු සම්මා සම්බුදුවරු, කොටස් තුනක් වෙති. ප්‍රඥාධික සම්මා සම්බුදුවරු, ශ්‍රද්ධාධික සම්මා සම්බුදුවරු, වීර්යාධීත සම්මා සම්බුදුවරු එම කොටස් තුන නියෝජනය කරති.

1. ප්‍රඥාධික සම්මා සම්බුදුවරු වසර සාරසංඛ්‍ය කල්ප ලක්ෂයක්ද,
2. ශ්‍රද්ධාධික සම්මා සම්බුදුවරු වසර අමා සංඛ්‍ය කල්ප ලක්ෂයක්ද,
3. වීර්යාධික සම්මා සම්බුදුවරු වසර සෙළොස් සංඛ්‍ය කල්ප ලක්ෂයක්ද පෙරුම් පිරිය යුතු වෙයි.

අප තථාගත ගෞතම බුදුරජාණන් වහන්සේ ප්‍රඥාධික සම්මා සම්බුද්ධත්යහ. සුමේධ තාපස ආත්මයේ දීපංකර බුදුහාමුදුරුවන් වෙතින් නියත විවරණය (ඒකාන්තයෙන්ම බුදු වන බව) ප්‍රකාශ වීමෙන් වසර සාරසංඛ්‍ය කල්ප ලක්ෂයකට අනතුරුව, දසමරුන් පරදා වෙසක් මස පුර පසළොස්වක දින ලෝකනායක ශ්‍රී සම්බුද්ධත්වයට පත්වූ සේක.

ජී. ඒ. පී. ජයලත්

"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

දළදා වරුණ
ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## ඔබ නමට බෞද්ධයෙක්ද?

ජාති, ජරා, ව්‍යාධි, මරණවලට ලක්වෙමින් සසර සැරිසරන සත්වයා හට සසරින් එගොඩ විය හැකි මාර්ගයක් සොයා ගැනීමට සමත් වූ එකම ශාස්තෘවරයා වන්නේ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ පමණි. උන්වහන්සේ තම නුවණින් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගෙන එය ලෝක සත්වයාගේ හිත සුව පිණිස දේශනා කළ සේක. එම ධර්මය අවබෝධ කර නොගත් බොහෝ දෙනා තවමත් සසර ගමනෙහි යෙදී සිටිති. කෙනෙක් කොතෙක් වාරයක් සංසාර චක්‍රයේ සැරිසැරියාද යන්න පිළිබඳවත්, තව කොතෙක් වාරයක් සසර සැරිසරන්නට සිදුවේද යන්න ගැනවත් ඔවුනට සිතාගත නොහැක.

අප බොහෝ දෙනෙක් නාමික බෞද්ධයන් බව අමුතුවෙන් කිව යුතු නැත. රට තුළ අධර්මය හා දුශ්චරිතය රජ කරන්නේ එබැවිනි. කොපමණ බණ කිව්වත් පුද්ගලයා හැදෙන පාටක් නොපෙනේ. අපරාධ රැල්ල දිනෙන් දින ඉහළ යන ප්‍රවණතාවක් රට තුළ පවතී. මුදලට හා වස්තුවට ගිජුව මහා සංඝයා වහන්සේලාගේ පවා වටිනා ජීවිත තුරන් කරන තරමට සමාජය තිරිසන් වී තිබීම කෙතරම් අවසනාවක්ද? මෙබඳු රටකට සදහම් දීපයක් යැයි කටපුරා කිව හැකිද? මේ අප ජීවත් වන්නේ බුදුරජුන් වැඩි දේශයක බව සිතන්නේ කීයෙන් කී දෙනෙක්ද?

අප අද ගෙවන ජීවිතය අතිශයින් බියකරුය. මේ සිටිනා තත්ත්වයෙන් මීට වඩා අඳුරු හා දුක්ඛිත තත්ත්වයකට පත්වීමේ ඉඩකඩ ඉතාමත් විශාලය. පංචශීල ප්‍රතිපදාවෙන් අප ඈත්වෙන්න, ඈත්වෙන්න රට තුළ ගොඩනැගෙන පරිසරය ඉතාමත් අයහපත් හා ඛේදජනක වීමට ඇති අවකාශය ඉතා විශාලය. මේ තත්ත්වයෙන් මිදීමට අප වහා ක්‍රියාත්මක විය යුතු කාලය එළඹ තිබේ.

පුද්ගල ජීවිත සාර්ථක කරගැනීමට සහ චිත්ත සන්තුෂ්ටිය මැනවින් හා ධාර්මිකව පවත්වාගෙන යාමට බුද්ධ දර්ශනයෙන් ලැබෙන පිටිවහල හා මගපෙන්වීම වෙනත් ආගමකට හෝ දර්ශනයකට නොදෙවෙනිය. එසේනම් බෞද්ධයන් වූ අප සැමට මේ පුංචි දිවයින සද්ධර්මය රජයන ධර්මදීපයක් කරගන්නට බැරිකමක් නැත. අපි දැන්වත් එම ධර්ම මාර්ගයට පිවිසෙමු. ■

සිරි සුගත තථාගත අප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අසූ හාරදහසක් ධර්මස්කන්ධයන්ගෙන් ස්පර්ශ වූ වම් සිරි දළදා වහන්සේ වැඩ සිටින ශ්‍රී දළදා මන්දිරය කෝටි සංඛ්‍යාත ජනතාවගේ වන්දනාවට ලක්වූ පරම පූජනීය ස්ථානයකි.

ශ්‍රී දළදා මන්දිරය කේන්ද්‍ර කරගෙන පවත්වන සතර මහා මංගල්‍ය අතර ඇසළ පෙරහර මහා මංගල්‍යය මනුලොව ශ්‍රේෂ්ඨතම පූජා මහෝත්සවයද වේ. මෙය හේතුභූත වන ප්‍රධාන කාරණා කීපයකි.

1. ශ්‍රීමත් දළදා වහන්සේ ප්‍රධාන කරගැනීම
2. බෞද්ධ කලා ශිල්ප ක්‍රියාත්මකව ප්‍රදර්ශනය කිරීම
3. තෙරුවන් ගුණ හා දේව බලය ප්‍රකට වීම
4. සාමූහික ජනතාව එක්තැන් වීම.

මනුලොව පවත්නා පරම පූජනීය වස්තුව ශ්‍රීමත් දළදා වහන්සේ බව සකල ලෝකයාම පිළිගෙන තම තමන් දන්නා ප්‍රමාණයෙන් ගරුසරු පවත්වන්නේය. මෙතෙක් මානව පරපුරේ කිසිම කෙනකුට මෙතරම් දේශන සංඛ්‍යාවක් ඉදිරිපත් කරන්නට තබා සිතීමටවත් නොහැකි විය. කෝටි සංඛ්‍යාත ඒ උතුම් අක්ෂර, වචන, වාක්‍ය, ගාථා, සූත්‍ර දේශනා කරන විට ශබ්ද මාත්‍රයක් පාසා උඩ කී දළදා වහන්සේගේ ස්පර්ශ වීමෙන් ශ්‍රී මුඛ පද්මයෙන් පිටවී ශ්‍රාවක චිත්ත සන්තානයට ඇතුල් වන්නේය. ශ්‍රී දළදා වහන්සේ අජීව වස්තුවක් වුවද අප බුදුරජාණන් වහන්සේ ප්‍රත්‍යක්ෂයෙන් දුන වදළ ඒ උතුම් සදහම් ජීවය ආරෝපණය කිරීමෙන් දකින, සිතන, කියන සැම දෙනාටම ලැබෙන ශ්‍රද්ධාව, කරුණාව, ප්‍රඥාව, වීර්යය, ක්ෂාන්තිය, සඟමොක් සුව ලබා දෙන්නේය.

අනුරපුර රාජධානි සමයේ කිත්සිරි මෙවන් රජ දවස පටන් වසර දහස් ගණනක් තුළ සිදුකළ පුද පෙරහර අපමණ වන්නේය. සෙන්කඩගල පුරවරයට දළදා වහන්සේ වැඩමවාගෙන මෙම දළදා මන්දිරියේ වඩා හිඳුවා කළ පූජෝපහාර පෙරහර අපමණය.



## දළදා ව
## ලෝකෙ

ශ්‍රී ලංකාවට භෞතික ස
අනුරාධපුර ශ්‍රී මහා බෝධීන්
මහා චෛත්‍ය රාජයාණන් ව
වහන්සේ යන පූජ්‍ය වස්තු ත
අනර්ඝතම එමෙන්ම ලෞකි
වශයෙන් මහා පුණ්‍ය බල ම
කිසිම දෙයකට සමාන වීම
නොහැකිය. එයින් ශ්‍රීමත් දළ
සිටුවරුන්, ජනතාව දිවමන්
සිතන, වඳින, පුදන, පතන
හෝ සැනසීමක්, ලාභයක්,
දෙන්නේය.

වර්තමාන ශ්‍රී දළදා මාලිග
වාස්තු විද්‍යාව, නක්ෂත්‍ර විද්‍
පෙදරේරු ශිල්පය ආදී සියල
කරගෙන වසර දහස් ගණන
සංරක්ෂණ ක්‍රමද භාවිත කෙ



"අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙ



# ...ඩම්මන හැම වසරක් ගාණේ
# ... කියනවා අභිමානය ලංකාවේ

...ත් කෙතරම් තිබුණද ...න්සේ, රුවන්වැලි ...ස් හා ශ්‍රී දළඳ ... මිහිමත ඇති ...ලෝකෝත්තර ...යෙන් මනුලොව ... සමීපයටවත් තැබිය ...හන්සේ රජවරුන්, ...ත් දුටුවා සේ දකින, ... කෙනෙකුටම කුමන ... බල මහිමයක් ලබා

... නිර්මාණය කිරීමේදී ... චිත්‍ර මූර්ති කලාව, ...ෂයයන් උපයෝගි ...පැවැතීමට අත්‍යවශ්‍ය ... ඇත.

ශ්‍රී දළඳ මාලිගාවේ පෙරහර පැවැත්වීමේදී සිදුකරන සිරිත් විරිත් සිය ගණනක් ඇති අතර ඒ සඳහා තේවා භාර මහා සංඝරත්නය, දියවඩන නිලමේ, කාරියකෝරාළ ඇතුළු නිලධරයන් ප්‍රධානව ක්‍රියා කිරීමෙන් කලට වේලාවට, නියමිත පරිදි පවිත්‍ර චේතනාවෙන් ශ්‍රද්ධාවෙන් සිදුකරන්නේය. පරිචිත ඥනයත්, පුරුද්දත් ඒ සඳහා අත්‍යවශ්‍ය වන්නේය. නැකැත් වේලාවට දෙන සංඥව අනුව රාජකාරි කාරයන් පවිත්‍ර නිල ඇඳුමෙන් සැරසී පැමිණ ගරුසරු ඇතිව තම තමන්ට නියමිත රාජකාරි හා සංකේත බාරගත් පසුව තේවා භාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් සධාතුක කරඬුව දියවඩන නිලමේ දෝතින් ලබාගෙන, පංචතූර්ය නාද මධ්‍යයේ මල් පාවාඩමකින් වැඩමවාගෙන අවුත් මංගල හස්ති රාජයාණන්ගේ හිස මත රන්සිව්ගෙය තුළ සුරක්ෂිතව වඩා හිඳුවන අවස්ථාව කෙතරම් අසිරිමත්දැයි කියා නිම කළ නොහැක.

දර්ශන මාත්‍රයෙන් ශ්‍රද්ධාවත්, සොම්නසත්, කුසල චේතනාවත් එක්වන්ව ජනිත වන ශ්‍රී දළඳ වහන්සේ මංගල හස්ති රාජයාණන්ගේ හිස මතින් වඩම්මවන විට දිවමන් බුදුරදුන් දුටුවා සේ වාසනා බල මහිමයක් ඇති වන්නේය. මල් උඩුවියන් යට, සුදු පාවාඩ මත දද කොඩි සේසත් ගත් නිලධරයන් පිරිවරා ගත් පංචතූර්ය නාද, සංඛ නාද, සාධු නාද, නින්නාද මේ වන විට නිතැතින්ම දෙහොත් මුදුන් දී හිස නැමෙන්නේය.


උඩරට වෙස් නැටුම, පෙරදිග නෘත්‍ය කලාවේ උපරිම කාලයට පත්වී ඇත්තේද ශ්‍රී දළඳ පෙරහර මූලික කරගෙනය. පෙර අපර දෙදිග සංචාරකයන්, දේශීය නාට්‍ය හා සංගීත රසිකයන් මන මෝහනය කරවන මෙම නෘත්‍ය කලාව ලාංකිකයන්ගේ අනන්‍යතාව පෙන්වන කලා සම්පතකි. විශේෂයෙන් ගජගා වන්නමට අනුව පය තබමින් වයන පදට අනුව ගයමින් සියඟනන් දෙපෙළට සිට නටන නළුවන්ගේ විලාසය සිතා, කියා, ලියා නිම කළ නොහැක්කේමය.

ශ්‍රී ලංකාවේ කලා ශිල්ප වැඩි වශයෙන් ආරක්ෂා පෝෂණය වන්නේ ශ්‍රී දළඳ පෙරහර මූලාධාර කරගෙන බව ප්‍රත්‍යක්ෂ වන්නේ ශ්‍රී දළඳ පෙරහර කරවන අයගේ අවංක උත්සාහය හා පෙරහර කිරීමේ කුසලතාව පිළිබඳ තොරතුරු දැනගැනීමෙනි.

සංගීතය, නර්තනය, චිත්‍ර, මූර්ති ආදී කලා ශිල්ප මෙන්ම අලි ඇතුන් ඇති කිරීමද ශිල්පීය වශයෙන්ද, ගුරු මුෂ්ටි වශයෙන් පාරම්පරික උරුම වූ සම්පත් වශයෙන් සියලු දෙනාටම අධ්‍යයනය කරන්නට ලැබෙන්නේද වාර්ෂිකව ශ්‍රී දළඳ මාලිගාවේ සිදුකෙරෙන මහා පෙරහර මංගල්‍යය නිසාය.

**පූජ්‍ය අමුණුපුර පියරතන නාහිමි**










...ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.'' - (ධම්ම පදයේ 3 වන ගාථාව)



# ඔබ දොහොත් මුදුන් දී වඳින දළදා වහන්සේ සතු ආශ්චර්යයයි මේ


ශ්‍රීමත් සුගත තථාගතයන් වහන්සේ මල්ල රජ දරුවන්ගේ උපවර්තන නම් සල් උයනේදී පිරිනිවීමෙන් පසු එහිම සඳුන් දර සෑයක ශ්‍රී බුද්ධ ශරීරය ආදහනය කළේය. එම ආදහනය සිදුවන කල්හි ඍද්ධිමත් ඛේම නම් මහරහතන් වහන්සේ බුද්ධ චිතකයෙන් වාම දළදා වහන්සේ රැගෙන කලිඟු රට බ්‍රහ්මදත්ත නම් රජු කරා එළඹ, එතුමා රත්නත්‍රය කෙරේ පහදවා අනතුරුව මේ දළදා වහන්සේ ඔහුට භාර කළේය. රජතුමාණෝද ඉමහත් භක්තියෙන් දළදා වහන්සේ භාරගෙන අලංකාර ගෘහයක එය තැන්පත් කර පුද පූජාවන් පැවැත්වූහ. ඒ රජ ඇවෑමෙන් එතුමාගේ පරපුරේ කසී, පුනත් ආදී රජවරුන්ද දළදා පූජා පවත්වමින් රජකම් කරන්නේ ගුහශිව නම් රජතුමාණෝද මේ දන්ත පුරයේ රාජ්‍යත්වයට පත් වූහ. බුදු බැතියෙන් තොර වූ මෙතුමා නිගණ්ඨ සාධුන්ට උපස්ථාන කළ ශිව භක්තිකයකු විය. දන්ත පුර වාසීන් බුද්ධ භක්තියෙන් යුක්තව දළදා පුද පිළිවෙත්හි අනවරතයෙන්ම නිරත වන බව දැක ඒ පිළිඳ තම අමාත්‍යවරුන්ගෙන් කරුණු විමසා දළදා වහන්සේ කෙරේ අතිශයින් පැහැදී නිගණ්ඨාගම අතහැර දන්ත ධාතුව උදෙසා වත්පිළිවෙත් කිරීමට උත්සුක විය. ගුහශිව රජුගෙන් එතෙක් සත්කාර, සම්මාන ලැබූ නිගණ්ඨ පූජකයෝ තම ලාභ සත්කාර නොලැබීමෙන් කනස්සල්ලට පත්ව කළිඟු රට අතහැර පැළලුප් නුවරට ගියහ. එකල එහි රජකම් කරනු ලැබුයේ පඬු නම් රජ කෙනෙකි. එතුමාද ශිවාගමට අනුව කටයුතු කරන අයෙක් වූහ. ගුහශිව රජ කළිඟු රට අධිපති වුවත් එතුමා එරට පාලනය කළ යුත්තේ පැළලුප් රජුගේ අණ අනුවය. මේ නිසා කළිඟු රටෙන් පලා ආ නිගණ්ඨ පූජකවරු ගුහශිව රජු මිථ්‍යා දෘෂ්ටිකව මිනී ඇටයකට ගරු බුහුමන් කරන්නේ යැයි ගතු කියා අනතුරුව තමන් එම රටින් පලවා හැරී යැයි කීහ. එබස් ඇසූ පඬු රජ තම චිත්තයාන නම් අමාත්‍යාට ඒ ගුහශිව රජු හා ඔහු පූජ්‍යත්වයෙන් සලකන මිනී ඇටය ගෙන ඒමට නියෝග කළේය. මේ නියෝගය පිළිගත් චිත්තයාන ඇමැති සිවුරඟ සේනාවද පිරිවරාගෙන කළිඟු පුරය වෙත ගමන් කළේය. පැළලුප් නුවරින් විශාල සේනාවක් තම පුරයට පැමිණෙන බව ඇසූ ගුහශිව රජු තම අමාත්‍යයන් සමග පිරිසක් පෙරග මන් කරවා ඔවුන් පිළිගෙන තම මාලිගයට කැඳවා මෙසේ බොහෝ පිරිසක් ආයුධ සන්නද්ධව තම පුරයට පැමිණීමට හේතු විමසූ විට ඔබතුමා මිථ්‍යා දෘෂ්ටික මිනී ඇටයකට ගරු කරන හෙයින් ඔබ සහ එම මිනී ඇටය පැළලුප් නුවරට ගෙන යාමට පැමිණි යැයි චිත්තයාන ඇමැතිවරයා කීවේය. ඉන්පසු ගුහශිව රජු බුදු දහමේ සහ දළදා වහන්සේගේ ගුණ වර්ණනා කර ඒ සියල්ලන්ම දළදා වහන්සේ කෙරේ පැහැදුවත්, පැළලුප් නුවර පඬු රජුගේ අණ ඉටුකළ යුතු හෙයින් දළදා වහන්සේ හා ගුහශිව රජු පඬු රජු වෙත ගෙන යන ලදී.

නිගණ්ඨ පූජකයන්ගේ ගතු කීම් නිසා වික්ෂෝපව සිටි පාණ්ඩු රජු ගුහශිව දැකීමෙන් කෝපාවිෂ්ටව දළදා වහන්සේ ගෙන එය විනාශ කරන මෙන් නිගණ්ඨයින් වෙත භාර කළේය. ඔවුහු ඉමහත් ප්‍රීතියෙන් දළදා වහන්සේ ගෙන එය මිනී ඇටයක් යැයි දක්වා පිළිස්සීමේ අරමුණින් කිහිරි අඟුරු ගොඩට වීසි කළේය. එකෙණෙහිම කිහිරි අඟුරු මතින් විශාල නෙළුම් මලක් පැන නැගී දළදා වහන්සේ පිළිගනු ලැබුයේය. දළදා වහන්සේගේ එම අසිරිමත් බව ඒ මිසදිටු රජු නොපිළිගත්තෙන් නැවතත් කිණිහිරක් මත තබා යගුලියකින් තැලීමට නියම කළේය. මිසදිටු නිගණ්ඨයන් එබස් අසා දළදා වහන්සේ කිණිහිරෙක තබා තලන්නට පටන් ගත් විට බලා සිටියවුන් විස්මයට පත් කරමින් දළදා වහන්සේ කිණිහිරෙහි ගිල්විණ. මේ දුටු නිගණ්ඨයෝ රජ කරා ගොස් සිදුව ඇති ආශ්චර්යයට හේතුව ශිව දෙවියන්ගේ බුද්ධ අවතාරය නිසා යැයි කියූහ. ඒ බස් පිළිගත් පඬු රජු කිණිහිරෙහි ගිල්ව තිබූ දළදා වහන්සේ ඉන් ඉවත් කරගැනීමට උත්සාහ කළත් එය කරගැනීමට ඔහුට හෝ එතන රැස්ව සිටි පිරිසෙන් කිසිවෙකුත් හටත් නොහැකි වූයේය. ඉන් දළදා වහන්සේ විෂයෙහි තරමක භක්තිමත් වූ පඬු රජු කිණිහිරෙහි ගැලී අසිරිමත් දළදා වහන්සේ ඉන් මුදවන යම් කෙනෙක් වෙත් නම් ඔහුට මහත් යස ඉසුරු ලබා දෙන බවට දේශය පුරා අණ බෙර ලැවීය. ඒ ඇසූ අනාථ පිණ්ඩික සිටුවරයාගේ මුණුබුරකු වූ අයකු දළදා වහන්සේ කරා අපිරිමිත ශ්‍රද්ධාවෙන් පැමිණ ඒ ධාතුන් වහන්සේට නමස්කාර කොට අනාථ පිණ්ඩික යනු මාගේ මී මුත්තා බවත් එතුමා බුදුන් වහන්සේ නොදැකම බුද්ධ යන වචනය අසා උන්වහන්සේ කෙරේ පැහැදුණු අයකු බවත් පවසා බුදුන් වහන්සේගේ නව අරහාදී බුදු ගුණත් කියා, මෙසේ අපිරිමිත ගුණයෙන් යුක්ත ඒ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙහි

වැඩ සිටි වාම දළඳ වහන්සේ ඔබ වහන්සේ නම් සහ මා කී බුදුගුණ සැබෑ නම් ඔය කිණිහිරෙන් ඉවත්ව අහසට පැන නැගී ප්‍රාතිහාර්යයන් පා සිටුවරයාගේ හිස මත වැඩ සිටි සේක. මේ ආශ්චර්යය දුටු නිගණ්ඨ පිරිස සුභද්‍ර සිටුගේ ගුප්ත වූ මන්ත්‍ර බලයකින් එසේ වූ බව රැස්ව සිටි අයට කී පසු මේ සිටු පුත් තෙමේ දළඳ වහන්සේ සුවඳ පැන් පිරූ පාත්‍රයක තැන්පත් කළේය. එහිදී සුදු හංසයකු මෙන් කිමිදෙමින්ද, නැවත මතුවෙමින්ද, ඔබ මොබ ගමන් කරමින්ද, කරකැවෙමින්ද, දළඳ වහන්සේ ප්‍රාතිහාර්යය පෑ සේක.

මෙසේ දුටුවන් විස්මයට පත් කරවමින් සම්බුදු දළඳුව ප්‍රාතිහාර්ය පෑවත් මිසදිටු නිගණ්ඨයන් එය රැගෙන නුවර මධ්‍යයේ ගැඹුරු වළක් හාරා දළඳ වහන්සේ එහි මිහිදන් කර ඇතුන් ලවා පාගවා එහි පස් තද කළත් දළඳ වහන්සේ නෙළුම් මලක් මතින් නැවත පොළොවෙන් මතු වූහ. ඉන්පසු මේ මිසදිටු නිගණ්ඨයින් දළඳ වහන්සේ අපවිත්‍ර දිය අගලකට වීසි කළහ. දළඳ වහන්සේ එහි පතිත වත්ම ඒ අගලපස් පියුමෙන් පිරි අලංකාර පොකුණක සිරි ගත්තේය. මේ ආශ්චර්යයන් සියල්ල දුටු රජතුමා දළඳ වහන්සේ කෙරේ පැහැදී අපිරිමිත ශ්‍රද්ධාවක් ජනිත කරගෙන උන්වහන්සේට විවිධාකාර පූජාවන් පවත්වා නැවතත් දළඳ වහන්සේගේ භාරකාරත්වය ගුහශිව රජුටම පැවරීය. ගුහශිව රජු දළඳ වහන්සේ නැවතත් තම නුවරට ගෞරවාන්විතව වැඩම කර පෙර සේම පුද පූජාවන් පවත්වමින් සිටින අතරතුර මේ දළඳ වහන්සේ වැඳීමට උදේනි නුවර දන්ත නම් කුමාරයෙක් නිතර පැමිණෙන අතර ඔහු කෙරේ පැහැදුණු ගුහශිව රජතුමා ඒ කුමාරයාට තම දියණිය වූ හේමමාලා විවාහ කරදෙනු ලැබේ.

දළඳ වහන්සේගේ අසිරිමත් බවේ කීර්ති රාවය දස දිසාවන්හි ප්‍රකට වන්නේ, ක්ෂීරධාර නම් රජ කුමරෙකු දළඳ වහන්සේ තමන් වෙත ලබා දෙන මෙන් ගුහශිව රජු වෙත පණිවුඩයක් යැවීය. එසේ නොවන්නේ නම් යුද්ධයකට සූදනම් වන ලෙස දැන්වූයේය. මෙය ඇසූ රජතුමා තම බෑණනුවන් හා දියණියට කතා කොට දළඳ වහන්සේ වෙනුවෙන් තමන් ක්ෂීරධාර සමග යුද්ධ කරන බවත් යුද්ධයෙන් තමන් පරාජය වන බව දැනෙන්නේ නම් දළඳ වහන්සේ රැගෙන ලංකාද්වීපයට ගෙන යන ලෙස දැනුම් දුන්නේය.



යුද්ධයෙන් තම පියා පරාජයට පත් වූ බව දැනගත් මේ දෙපළ දළඳ වහන්සේගේ ආරක්ෂාව පතා බමුණු වෙස් ගෙන ලංකාද්වීපයට ඒමට පිටත්ව ගං තෙරකට සම්ප්‍රාප්ත වූහ. දළඳ වහන්සේ ගංතෙර වැලි ගොඩක් මැද තැන්පත් කර මේ දෙදෙනා ගිමන් හරිමින් සිටින අතර ඍද්ධිමත් ථෙරනමක් ගංතෙරට උඩින් ගමන් කරන්නේ වැලිගොඩ මතින් ස්වේත රශ්මි මාලාවක් විහිදෙනු දැක එතැනට පැමිණ මේ දෙදෙනාගෙන් කරුණු විමසා ආරක්ෂාව පතා දළඳ වහන්සේද සමග ලංකාද්වීපයට යන බව සැල කිරීමෙන් පසු උන්වහන්සේ දළඳ වහන්සේට නමස්කාර කර මේ ගමන අතර තුර යම් බයක් වන්නේ නම් තමන් සිහි කරන මෙන් ඒ දෙපළට දන්වා එතනින් ඉවත් වූහ.

අනතුරුව ඒ ගංතෙරේ මදක් නැවතී සිටි මේ දෙදෙනා දළඳ වහන්සේ සහිත කරඬුව වැලි ගොඩම තුළ තබා ස්නානයෙන් පසු දළඳ වහන්සේ වැඩම කිරීමට සූදනම් වුවත් එය තැන්පත් කළ ස්ථානයේ නොවූයේය. ඒ වනවිට කරඬුව සහිත දළඳ වහන්සේ මාණික්‍යයක් යැයි සිතා පණ්ඩුහාර නම් නාගයකු විසින් ගිලිනු ලැබ ඇත. ඒ බව නොදත් මේ දෙපළ රහතන් වහන්සේ මතකයට නගා උන්වහන්සේගේ උපකාරයෙන් නා රජුගෙන් දළඳ වහන්සේ සහිත කරඬුව ලබාගෙන, හේමමාලා කුමරිය තම හිස් මුදනේ තබා මාණික්‍යමය කරඬුව වැසෙන සේ කොණ්ඩය මුදුන් කර බැඳගෙන තමලිංගමුව නම් තොටුපළින් නැව් නැගී ලංකාවට ඒමට පිටත් වූවාය. අතරමගදී නා ලොව නාගයින් විසින් ඔවුන්ගේ නැවේ ගමනට බාධා කර ඇත. එම බාධාවන් ද රහතන් වහන්සේ සිහි කිරීමෙන්ම දුරලාගෙන ලංකා පටුනෙන් ලංකාද්වීපයට ගොඩ බැස තන්තිරිමලය හරහා අනුරාධපුරයට සේන්දු වී මේඝගිරි විහාරයට ගොස් එහි භික්ෂූන් වෙත තමන් දෙදෙනා පිළිබඳ තොරතුරුත් පැමිණි කරුණුත් දන් වූ පසු ඒ තෙරුන් වහන්සේලා බුදුරජාණන් වහන්සේගේ වාම දළඳ වහන්සේ කළිඟු රටේ සිට තම විහාරයට වැඩම කර ඇති බව එවකට රජ කළ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජතුමාට දන් වූහ. අතිශය සන්තෝෂයෙන් මේඝගිරියට ගිය රජතුමා දළඳ වහන්සේ දැක එහි වර්ණ රැස් විහිදුවමින් පෙළහැර පානු දුටු රජතුමා බුද්ධාලම්භන ප්‍රීතියෙන් පිනාගොස් දළඳ වහන්සේට

"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - විනීල ජාතකය"


වන්දනාමාන කොට උන්වහන්සේ සාදරයෙන් පිළිගෙන දේවානම්පියතිස්ස රජු කරවූ ධම්මචක්ඛ නම් ස්ථානයෙහි දළදා වහන්සේ තැන්පත් කළේය. එතැන් පටන් එම ස්ථානය දඨාධාතු සර නමින් ප්‍රකට විය. දළදා වහන්සේ මෙරට ගෙනා දන්ත කුමරු හා හේමමාලා යන දෙපළට සබරගමුවෙන් ගම්වරයක් ප්‍රදානය කර කීරවැල්ල නම් ග්‍රාමවරයේ පදිංචි කර ඇත.


අනතුරුව වාර්ෂික දළදා වහන්සේ උදෙසා අසිරිමත් පෙරහැරක් කරන මේ රජතුමා පෙරහැර අවසානයේ දළදා වහන්සේ මහජනතාවට ප්‍රදර්ශනය කරමින් ඔවුන්ට පූජා පැවැත්වීමට ඉඩකඩ සැලසීය. එතුමාගෙන් පසු අනුරාධපුරය රාජධානිය කර ගනිමින් රාජ්‍යත්වයට පත් බොහෝ රජවරුද දළදා වහන්සේට වන්දනාමාන ගරුබුහුමන් කළහ. පොළොන්නරුව රාජධානිය කරගත් පළමුවන විජයබාහු රජු එහි දඨාධාතු සරයක් කරවා දළදා වහන්සේ ගෞරවාන්විතව එයට වැඩම කරවන ලදී. විජයබාහු රජුගෙන් පසු රටේ නැවතත් රාජ්‍යයත්ව සඳහා මාණාභරණ, පරාක්‍රමබාහු, ගජබා අතර බල අරගල ඇතිවිය. මේ නිසා මාණාභරණ දළදා වහන්සේ සඟවා ගෙන රුහුණට යන ලදී. අවසානයේ සුගලා දේවිය සතු වූ දළදා වහන්සේ මහත් පරිශ්‍රමයකින් ලබාගත් පළමු පරාක්‍රමබාහු එය පොළොන්නරුවට නැවත වැඩමවා ගෙන විත් උසස් ලෙස පූජාවන් හා පෙරහැර පවත්වා ඇත. මහාවංශයට අනුව මේ රජතුමා වාර්ෂිකව පවත්වන පෙරහැරක් සූදනම් කරමින් සිටින විට ධාරාණිපාත වර්ෂාවක පෙර නිමිති පහළ විය. එයට බිය වූ පෙරහැර සංවිධායක අමාත්‍යවරු වර්ෂාවෙන් පෙරහැරට බාධා ඇතිවිය හැකි නිසා එදින පෙරහැර නියමිත වේලාවට නොපැත්වීමට යෝජනා කළත් රජතුමා එය නිශ්චිත වේලාවටම ආරම්භ කර රජතුමා ද පෙරහැරේ ගමන් කළේය. පෙරහැර ගමන් මාර්ගයට බාධාවක් නොවී වටපිටාවට පමණක් ධාරාණිපාත වර්ෂාවක් ඇති වී ඒ ඒ තන්හි උල්පත් දිය ධහරාවන් ද පැන නැගී ඇත. දළදා වහන්සේ ආශ්චර්යක් නිසා පෙරහර ගමන් මාර්ගයට වර්ෂාවෙන් බාධාවක් වී නැත.

පොළොන්නරු රාජධානිය කාලිංග මාඝගේ ආක්‍රමණයට ලක්වන විට එහි වැඩසිටි දළදා වහන්සේ උත්තර මූල වැසි වාගීශ්වරාදි මහ තෙරුවරුන් විසින් කොත්මලේට වැඩම කර තිබේ. කොත්මලේ වැඩසිටි දළදා වහන්සේ තුන් වැනි විජයබාහු රජු විසින් බෙලිගලටත්, කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා විසින් දඹදෙණියටත් වැඩම කර වූ දළදා වහන්සේ මේ රජතුමා විසින්



"උත්සාහවන්තයා සියල්ල ජයගනී - වණ්ණුපථ ජාතකය"






මැණික්වලින් කරඬුවක් කරවා ඒ මැණික කරඬුව බහාලීමට තවත් රන් කරඬුවක් ද එය බහා තැබීමට තවත් කරඬුවක්ද කරවා දළද වහන්සේ බහු කරඬු තුළ තැන්පත් කිරීමේ සිරිත අරඹා ඇත.

බෝසත් විජයබාහු රජතුමා විසින් නැවත පොළොන්නරුවට වැඩම කළ මේ දළද වහන්සේ පළමු බුවනෙකබාහු රජතුමා විසින් යාපහුවට ගෙන ගොස් තැන්පත් කර ඇත. මෙහිදී ආචාර්ය චක්‍රවර්තී දළද වහන්සේ පැහැරගෙන පඬිරට කුලසේකර නම් සොලී රජුට භාරදෙනු ලැබේ. ඉන්පසු ලක් රජය භාර ගන්නා උපායෙහි දක්ෂ තෙවන පරාක්‍රමබාහු යාපනය උකසට දෙන බව කියා උපක්‍රමශීලීව නැවත දළද වහන්සේ ලංකාවට ගෙනවිත් පොළොන්නරුවේ තැන්පත් කළේය. අනතුරුව කුරුණෑගල රාජධානිය කරගත් පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා දළද වහන්සේ එහි වැඩමවා පුද සත්කාර කළ අතර කෝට්ටේ රජ පැමිණි හයවන පරාක්‍රමබාහු නරපතීන් විසින් දළද වහන්සේ ජයවර්ධනපුරයට වැඩමවා තෙමහල් දළද ගෙයක් කරවා නවරත්නයෙන් කළ රන් කරඬුවක දළද වහන්සේ තැන්පත් කර නානාප්‍රකාර මැණික්වලින් අලංකාරවත් කරන ලද තවත් කරඬුවක එය බහා එම කරඬුවද නැවතත් රනින් කළ කරඬුවක බහා එයද රන් ආලේපිත තවත් කාන්තිමත් කරඬුවක තැන්පත් කළේය. මෙතුමාගෙන් පසු රාජ්‍යත්වයට පත්වන සීතාවක රාජසිංහයන්ගෙන් බුදු දහමට වන අනර්ථයන් දුටු තත්කාලීනව විසූ ගිරිපිටියේ රාළ දළද වහන්සේගේ ආරක්ෂාව පතා සබරගමුවේ දෙල්ගමුවට වැඩමවා රහසිගතව කුරහන් ගලක තැන්පත් කරවා ඇත. අනතුරුව සෙන්කඩගල රාජධානිය කරගන්නා පළමු විමලධර්මසූරිය රජතුමා දෙල්ගමුවේ වැඩ සිටි දළද වහන්සේ මහනුවරට වැඩමවා වර්තමාන ශ්‍රී දළද මාලිගාවේ තැන්පත් කරන්නේ නව රුවනින් සහ සත් රුවනින් අලංකාර කරන ලද ස්වර්ණමය කරඬුවක උන්වහන්සේ ගෞරවාකාරයෙන් වඩා හිඳුවාය. අනතුරුව රාජ්‍යත්වයට පත්වන කීර්ති ශ්‍රී රාජසිංහ මහරජතුමන්ගේ කාලයේදී පෘතුගීසීන් මහනුවර ආක්‍රමණය කිරීමට සැලසුම් කරන විට දළද වහන්සේ රජතුමාගේ නියමයෙන් අස්ගිරි විහාරයේ ගණනායකත්වයට පත්ව සිටි නාවින්නේ ධම්මදස්සි නාහිමි විසින් මැද මහනුවරට ගෙන ගොස් ආරක්ෂා කර ඇත. ආක්‍රමණ බිය පහව ගිය පසු නැවත මහනුවරට ගෙන එනු ලබන දළද වහන්සේට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් ප්‍රමාණයෙන් එකිනෙක කුඩා වන සේ රන්මය කරඬු හතරක් කරවා කුඩා කරඬුව තුළ දළද වහන්සේ තැන්පත් කර අනතුරුව එය අනෙකුත් කරඬු තුළ තැන්පත් කර ඇත. වර්තමානය වන විට යථෝක්ත කරඬු සතරට අමතරව දළද වහන්සේ තැන්පත්ව ඇත්තේ ඇහැලේපොළ නිලමේ විසින් කරවා පූජා කර ඇති රන්මය කරඬුව තුළ බහා ඇති මැණික් ඇල්លූ කුඩා රන් කරඬුවකය. එය අස්ගිරියේ කරඬුව නමින් ව්‍යවහාර වේ.

සෙන්කඩගලපුර අවසන් රජතුමා ශ්‍රී වික්‍රම රාජසිංහය. එතුමා ජීවග්‍රහයෙන් ඉංග්‍රීසීන් විසින් අල්වා ගත් පසු උඩරට රාජධානියේ හිමිකරු වූයේ වික්ටෝරියා රැජිණය. ඇය අප රට භාරගන්නේ ප්‍රසිද්ධ උඩරට ගිවිසුම අනුවය. ඒ අනුව එතුමියාගේ උපදෙස් පරිදි ලංකා ආණ්ඩුව කරවූයේ සර් එඩ්වඩ් බාන්ස්ය. ඉංග්‍රීසීන් යටතේ දළද වහන්සේට යම් නිගරුවක් වේ යැයි සැක කළ එවකට දළද තේවාවෙහි නිරතව සිටි වාරියපොළ සුමංගල නාහිමි රහසිගතව දළද වහන්සේ වැඩ සිටි කරඬුවෙන් ඉවත් කරගෙන දඹුලු කැලයට ගෙන යන ලදී. දළද වහන්සේ නොදුටු බාන්ස් ආණ්ඩුකාරයා අස්ගිරි මල්වතු උභය විහාරයේ භික්ෂූන් වහන්සේලා 40 නමක් සිරගත කරන ලදී. එම ශෝචනීය පුවත කන වැකුණු සුමංගල හිමි දළද වහන්සේ ඉංග්‍රීසි රජයට භාර දුනි. ඉන්පසු එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරතුමා දළද වහන්සේ මහනුවර ශ්‍රී දළද මාලිගාවේම තැන්පත් කර ආරක්ෂා විධිවිධාන යෙදුවේය. අදද දළද වහන්සේ වැඩ සිටින කුටියේ මහ දෙරට ඉදිරියෙන් ඇති යකඩ ගේට්ටුව ඉන් එක් ආරක්ෂක ක්‍රමයකි. කෙසේ නමුත් අන්‍ය ජාතික ආගමකට සැලකීම පිළිබඳව බ්‍රිතාන්‍ය දේවගැතිවරයන් බෙහෙවින් විරෝධය ප්‍රකාශ කළෙන් 1847 ඔක්තෝබර් 2 වෙනි දින ශ්‍රී දළද වහන්සේගේ භාරකාරත්වය මල්වතු විහාරයේ මහානායක පරකුඹුරේ විපස්සි නාහිමියන්ටත් අස්ගිරි විහාරයේ මහානායක උඩුමුල්ලේ රතනජෝති නාහිමියන්ටත් එවකට සිටි දෙහිගම දියවඩම නිලමේතුමාටත් ඉංග්‍රීසීන් විසින් භාර දී ඇත. එදින සිට අද වනවිටත් රාජ්‍යත්වයේ සංකේතය වූ ශ්‍රීමත් දළද වහන්සේ අස්ගිරි මල්වතු මහනාහිමිපාණන් වහන්සේලා භාරයේ වැඩ වෙසෙති.


**මහනුවර අස්ගිරි මහා විහාරයීය**
**කාරක සංඝ සභික, ශ්‍රී චන්ද්‍රානන්ද**
**බෞද්ධ විද්‍යාලයාධිපති,**
**ආචාර්ය ගොඩගම මංගල ස්ථවිර**

# ධර්ම දානයේ වටිනාකම



ත්‍රිලොවක තිලක වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ 'සබ්බදානං ධම්ම දානං ජිනාති' යැයි වදාරා ඇති අතර, ධර්ම දානමය පින සියලුම දානමය පිංකම් අභිභවනය කරන බව ද පවසා ඇත. ධර්ම දානයේ අගය පිළිබඳව උන්වහන්සේ දේශනා කොට ඇත්තේ මෙසේය.

'ඉදින් වනාහි සක්වල ගැබ සිට නේවසඤ්ඤානාසඤ්ඤායතන අරූපී බඹලොව දක්වා අතරක් නැතිව සිටින සේ වඩා හිඳුවා බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලාට කෙසෙල් බඩ (ගොබ) මෙන් අතිශයින්ම දුහුල් සිනිඳු සිවුරු දෙන්නේ වේද, ඒ චීවර දානමය පිංකමට ද වඩා එහි සතර පද ගාථාවකින් කරන ලද ධර්ම අනුමෝදනාව ශ්‍රේෂ්ඨ වේ. තව ද, ''තං හි දානං තස්සා ගාථාය සෝළසිං කලං නාග්ඝති'' යැයි එහි වදාරා ඇති පරිදි ඒ සක්වල ගලේ සිට භවාග්‍රය දක්වා අතරක් නැතිව බුදු, පසේබුදු, මහ රහතුන් වඩා හිඳුවා දුන් දානයෙහි විපාකය සතර පද ගාථාවකින් අනුමෝදනා බණ කියා ලද විපාකයෙන් සොලොස් කලාවකුදු (දහසයෙන් කොටසකුදු) නොවටී.'

බුදු බණ පදයක් නමුදු දේශනා කිරීම, ශ්‍රවණය කිරීම මහත් ඵල ගෙන දේ යැයිද උන්වහන්සේ වදාරා ඇත. 'සක්වල ගැබ සිට භවාග්‍රය දක්වා අතරක් නැතිව බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා වඩා හිඳුවා දෙන ලද ප්‍රණීත පිණ්ඩපාත දානයට ද වඩා ධර්ම දානමය පිංකම ශ්‍රේෂ්ඨ වේ. එසේම වඩා හිඳුවා පාත්‍ර පුරවා දෙන ලද ගිතෙල් ආදී බෙහෙත් දානයට ද වඩා ධර්ම දානමය පිනම ශ්‍රේෂ්ඨ වේ. එසේම මහා විහාරයන්ට සමාන විහාර ද, එසේම ලෝවාමහාපාය වැනි ප්‍රාසාදයන් නොයෙක් සියදහස් ගණනින් කරවා දෙන ලද සේනාසන දානයට ද වඩා ධර්ම දානමය පිනම උතුම් වේ.'

අනාථ පිණ්ඩික සිටුතුමා දෙව්රම් වෙහෙර සඳහා කළ පනස් හතර කෝටියක ධන පරිත්‍යාග චේතනාවටද වඩා යටත් පිරිසෙයින් සතර පද ගාථාවකිනුදු අනුමෝදනා ධර්ම දේශනයක් සිදු කෙරේ නම්, ධර්ම දානමය පිංකමක් සිදු කෙරේ නම් ඒ ධර්ම දානමය පිංකමම දානමය පිංකම් අතර අග්‍ර වේ, ශ්‍රේෂ්ඨ වේ, උතුම් වේ යැයි දක්වා ඇත. එයට හේතුව නම් ඉහත කී සිවුරු පිදීම පිණ්ඩපාත දාන සෙනසුන් ඉදිකිරීම් ආදී පුණ්‍ය කර්ම කරනුයේ ධර්මය අසා දැනගත් බැවිනි. ධර්මය දැන කියා ගැනීමට නොලැබුණි නම් කැඳ සරලුවකුදු, බත් හැන්දකුදු නොදෙන බව ධර්මයේ පෙන්වා ඇත. මේ කරුණින් ද ධර්ම දානමය පිංකමම සියලු දන් පරදවන බව දත යුතුය. තවද රහත් බෝධියෙන් නිවන් දුටු පිරිස අතර අගතැන්පත් සැරියුත් ස්වාමීන් වහන්සේට කල්පයක් මුළුල්ලෙහි වසින වර්ෂාවේ දියබිඳු ප්‍රමාණය කීමට තරම් මහා නුවණක් ඇත්තේ ය. මේ තරම් නුවණක් ඇති සැරියුත් හිමිට ද බණ පදයක් දැන ගැනීමට නොලැබුණි නම් නිවන් දැකීමට නොහැකි වන්නේ ය. මේ හේතුවෙන් ධර්ම දානමය පිනම සියලු දානමය පිංකම්වලට වඩා ශ්‍රේෂ්ඨ වන බව, අග්‍ර වන බව තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ සක් දෙව්ඳුට පවා වදාරා ඇත.

'පින්වත් මහණෙනි, මේ දාන දෙකක් තිබෙනවා. ඒ තමයි ආමිස දානයත්, ධර්ම දානයත්. පින්වත් මහණෙනි, මේ දාන දෙක අතර මේ ධර්ම දානය තමයි අග්‍ර වන්නේ. පින්වත් මහණෙනි, මේ බෙදා හදා ගැනීම් දෙකක් තියෙනවා. ඒ තමයි ආමිසය බෙදා හදා ගැනීමත්, ධර්මය බෙදා හදා ගැනීමත්. පින්වත් මහණෙනි මේ බෙදා හදා ගැනීම් දෙක අතර අග්‍ර වන්නේ ධර්මය බෙදා හදා ගැනීමම තමයි. පින්වත් මහණෙනි, අනුග්‍රහයනුත් දෙකක් තියෙනවා. ඒ තමයි ආමිසයෙන් කරන අනුග්‍රහයත්, ධර්මයෙන් කරන අනුග්‍රහයත්. පින්වත් මහණෙනි, මේ අනුග්‍රහයන් දෙක අතර අග්‍ර වන්නේ මේ ධර්මයෙන් කරන අනුග්‍රහය මයි. පින්වත් මහණෙනි, මේ යාග දෙකක් තියෙනවා. ඒ තමයි ආමිස යාගයත්, ධර්ම යාගයත්. පින්වත් මහණෙනි, මේ යාග දෙක අතරින් වඩාත්ම අග්‍ර වන්නේ මේ ධර්ම යාගය ම යි.'

- බ්‍රාහ්මණ සූත්‍රය - ඉතිවුත්තක පාළි -
ඛුද්දක නිකාය -

# මීගහකුඹුර ශූරීන් කීර්ති ශ්‍රී ග්‍රන්ථ විශාරද ගෞරව නාමයෙන් පිදුම් ලබයි



මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ දේශීය බෞද්ධ කටයුතු කාර්යාංශයේ ලේකම් කේ. මීගහකුඹුර මහතා විසින් දශක තුනක කාලයක් තිස්සේ බෞද්ධ ග්‍රන්ථ සංස්කරණය තුළින් සිදුකරනු ලබන ධර්ම ශාස්ත්‍රීය සේවය අගයමින් මල්වතු මහා විහාරය, විංහත් වර්ගික කාරක මහා සංඝ සභා සම්මතයෙන් මල්වතු මහා විහාර පාර්ශ්වයේ අති ගෞරවනීය මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමිපාණන් වහන්සේ විසින් ''කීර්ති ශ්‍රී ග්‍රන්ථ විශාරද'' යන ගෞරව නාමය පිරිනමා ඇත. සිය ගෞරව නාමය පිළිබඳ ශ්‍රී සන්නස් පත්‍රය, මල්වතු පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමිපාණන් ප්‍රධාන සානුනායක කාරක මහා සංඝ සභාවේ ආශිර්වාදයෙන් අගෝස්තු මස නව වැනිදා (9) සවස 3.00 ට මල්වතු මහා විහාරයීය ඓතිහාසික මංගල උපෝෂථාගාරයේදී සම්භාව්‍ය ගිහි පැවිදි උතුමන්ලාගේ සහභාගිත්වයෙන් පවත්වනු ලබන උත්සවයකදී ලබාදෙනු ඇත. මීගහකුඹුර මහතාට මෙහිදී මහා සංඝරත්නය විසින් සෙත් පිරිත් සජ්ඣායනා කර ආසිරි ප්‍රාර්ථනා කිරීමද සිදු කෙරේ.


මීගහකුඹුර මහතා දශක ගණනාවක් ශ්‍රී දළදා මාලිගාව සහ මල්වතු අස්ගිරි උභය මහා විහාර කේන්ද්‍රස්ථානය කරගෙන සිදුකරන බෞද්ධ සාහිත්‍ය හා බෞද්ධ ශාස්ත්‍රීය සේවය අගයමින් වර්ෂ 2017 අප්‍රේල් 26 වෙනි දින අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ කාරක මහා සංඝ සභා සම්මතයෙන් ඒ මහතාට 'ධර්ම ශාස්ත්‍රීය ශූරී' යන ගෞරව නාමයද අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක සානුනායක කාරක මහා සංඝ සභාව විසින් පිරිනමනු ලැබීය.

"අධික ලෝභයෙන් යුතුව යුක්තියට පිටුපාන අය වැනසෙති - සේරිවාණිජ ජාතකය"

මැලිබන් කිරි

# අභයදාන

ගව සම්පත සුරැකීමේ මහඟු සත්කාරය....






ගිරාදුරුකෝට්ටේ ශ්‍රී ධර්මෝදය මහ පිරිවෙනේ පරිවෙනාධිපති නාපටවල ධම්මානන්ද නායක ස්වාමීන්වහන්සේගේ සහ මාදන්වල මහ පිරිවෙනේ පරිවෙනාධිපති අඹිලියද්දේ ගුණරතන නායක ස්මීන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් කිරි ගවයන් නිදහස් කළ අවස්ථාව

## 2017 නිකිණි පොහොය වෙනුවෙන් පැවැත්වූ මැලිබන් කිරි අභය දාන වැඩසටහන්

- ස්වාධීන රූපවාහිනිය සමඟින් පොළොන්නරුව රාජකීය විදුහලේදී කිරි ගවයන් 10 දෙනෙකු (2166 - 2175)
- රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය සමඟින් මාතලේ කූඹියන්ගොඩ ශ්‍රී නිකේතනාරාමයේදී කිරි ගවයන් 03 දෙනෙකු (2176 - 2178)

මැලිබන් කිරි අභයදාන වැඩසටහනට සහභාගී වීම සඳහා සම්බන්ධීකරණ උපදේශක අමතන්න 077 4 558 570

Maliban Kiri



# කළ ගුණ ඇති සත්පුරුෂ ජීවිතයේ වැදගත්කම කියාපාන

## සච්චංකිර ජාතකය


ත්‍රෛලෝක්‍යතිලක වූ චූඩාමාණික්‍ය වූ ශාක්‍යමුනීන්ද්‍ර තිලෝගුරු අප බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි වධයට උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය වදාළ සේක. දම්සභා මණ්ඩපයෙහි රැස්වූ භික්ෂු සංඝයා වහන්සේ, දේවදත්ත ස්ථවිරයන් වහන්සේ සර්වඥයන් වහන්සේගේ ගුණ නොදැන වධයට උත්සාහ කරතියි ආදී වශයෙන් දේවදත්තයන්ගේ නුගුණ කියමින් හුන් කල්හි, බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට, තමන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩම කිරීමට පෙරාතුව කවර කතාවකින් යුක්තව සිටියේදැයි විචාරා දැන, දේවදත්තයන් දැන් පමණක් නොව පෙරත් වධයට උත්සාහ කර ඇතැයි වදාරා, මෙම අතීත කතාව ගෙනහැර දක්වා වදාළ සේක.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන කාලයෙහි ඒ රජුට දුෂ්ටකුමරු නම් පුත්‍රයෙක් විය. ඔහු නපුරුය. දුෂ්ටය. පරුෂය. නොබැණ, නොගසා කිසිවෙකු සමගවත් කතා නොකරන්නේය. යකෙකු මෙන් අප්‍රිය වන්නේය. ද්වේශ උපදවන්නේය. ඒ කුමරා එක් දිනෙක ගඟෙහි ජල ක්‍රීඩා කරනු පිණිස මහපෙරහරින් ගංතෙරට ගියේය. එවිට අහසෙහි මහා මේඝයක් පැනනැගී අවට අන්ධකාර විය. ඔහු දාසයන්ට කතා කොට මා ගඟ මැදට ගෙන ගොස් නහවන්නැයි කීය. කුමරා ගඟ මැදට ගෙන ගොස් ඇමතියෝ රජතුමා අපට කුමක් කරන සේක්ද? මේ පාපී කුමාරයා මෙතනම මරමුයි කුමන්ත්‍රණය කොට ගඟ මැද තනිකොට දමා දාසයෝ මාළිගයට පැමිණියහ. රජු කුමාරයා කොහිදැයි විචාළ විට, අපි කුමාරයා දුටුවේ නැත. වැසි නැගෙනු දැක දිය කිමිඳ ඉදිරියට එන්න ඇතැයි සිතා අපි මෙහි පැමිණියෙමුයි කීහ. එබස් ඇසූ රජතුමා ගංතෙරට ගොස් පරීක්ෂා කරවන්නැයි කීහ. ගංතෙරට ගොස් සොයා බැලූ නමුත් කිසිවෙක්

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්දගුත්ත ජාතකය"

කුමාරයා නොදුටුවේය. ඒ කුමාරයා මේඝයෙන් අන්ධකාරව වැසි වසින විට එක් දඬුකඩක් දැක එහි ඉඳ මරණ බයින් තැතිගෙන අඬ අඬා ගියහ.

බරණැස් නුවර වාසය කළ එක් සිටු පුත්‍රයෙක් ධන නිධාන වස්තු ලෝභයෙන් නිධානයක් සමීපයෙහි සර්පයෙක්ව උපන්නේය. එක් සිටු පුත්‍රයෙක් තිස්කෙළක් ධන නිධාන කොට තෘෂ්ණාවෙන් මූසිකයෙක්ව උපන්නේය. ඔවුන් දෙදෙනා වාසය කළ තැනට ද ජලය ගලා ආවේය. ඔවුන් දෙදෙනා පීනා ගොස් රාජකුමාරයා එල්ලීගෙන යන්නා වූ දඬුකඩට පැමිණ කඳ පිටට විත් සිටියහ. ඒ ගංතෙර දිඹුල් රුකක් ඇත. එහි එක්තරා ගිරා පෝතකයෙක් වාසය කළේය. වැසි වසින විට ගිරා පෝතකයාට පියඹා යා නොහී දඬුකඩෙහි එක් කොනක සිටියහ. මෙසේ සතරදෙනම එක්ව ගඟෙහි යන්නා වූ අප මහබෝසතාණෝ කසී රට ප්‍රසිද්ධ බ්‍රාහ්මණ වංශයෙහි ඉපිද ඍෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව ඒ ගඟවක්කලමෙහි පන්සලක් කොටගෙන වාසය කළහ.




බෝසතාණෝ මධ්‍යම රාත්‍රියෙහි සක්මන් කරන විට රාජ කුමාරයාගේ බැගෑපත් හඬ අසා මා වැනි මෛත්‍රී කරුණාවෙන් යුක්ත වූ තාපසයෙක් බලා සිටිය දී මේ පුරුෂයාගේ මරණය සුදුසු නොවේ. දියෙන් ගොඩගෙන ඔහුට ජීවිත දානය දිය යුතුයැයි සිතා, කුමාරයාට බිය නොවන්නැයි පවසා ගඟට බැස දිය සරස පීනා දඬුකඩ කොනකින් අල්ලාගෙන ශක්ති සම්පන්න බෝසතාණන් කුමාරයා ඔසවාගෙන ගොඩ සිටුවා ඒ නාග සර්පාදීනුත් ගොඩ ගෙන පන්සලට ගෙන ගොස් ගිනි මොළවා පළමුව සර්පාදීන්ට ආහාර දී, පසුව රාජ කුමාරයාට පළාඵල දුන්නාහුය. මා රාජකුමාරයෙකැයි නොසිතා තිරිසනුන්ට සත්කාර සම්මාන කොට සම්බාහනය කරන්නේයැයි බෝසතුන් කෙරෙහි ආඝාත බැන්දේය.

ඉක්බිත්තෙන් කීප දවසක් ගිය කල්හි ඇඟ බල ශක්තිමත්ව ගඟ දිය ද බැස ගිය කල්හි සර්පයා තාපසයන් වහන්සේ වැඳ, ස්වාමීනි මට බොහෝ උපකාර කරන ලදී. මම දිළිඳු වූ කෙනෙකු නොව අසවල් තැන මගේ සතළිස් කෙළක් ධන නිධාන කොට ඇත. නුඹ වහන්සේට ධනය අවශ්‍ය විටෙක ඒ සියලු ධනය දීමට හැකිය. ඒ ස්ථානයට නුඹවහන්සේ අවුත් දීර්ඝ යැයි කියා අමතන්නැයි පැවසූහ. මීයාත් එසේම තාපසයන්ට වැඳ ඔහු සතු ධනය පවරා අසවල් තැනට පැමිණ මට මූසිකයායි කැඳවූ කල ඒ වස්තුව ගත මැනවයි කීවේය. ගිරවා ද තාපසයන් වැඳ මට වස්තු නැත. නුඹවහන්සේට රත්ඇල්සාලෙන් ප්‍රයෝජනයක් ඇති විට මා වසනා අසවල් තැනට අවුත් සුවපෝතකයැයි කියා අඬගහනු මැනවි. එවිට මම මගේ නෑයන්ට කියා ගැල් පිරෙන පමණින් රත්හැල් ගෙන දෙන්නට සමර්ථ වෙමියි කියා ගියේය. රාජ කුමාරයා මිත්‍රද්‍රෝහී බැවින් කිසිවක් නොකියාම බෝධිසත්වයන් තමන් සමීපයට ආ කල මරමියි සිතාගෙන, ස්වාමීනි මා රාජ්‍යයේ පිහිටි කල වැඩිය මැනවයි කියා ගියේය. රාජ කුමාරයා නුවරට ගොස් නොබෝ කලකින් රජ විය.

බෝධිසත්වයන් වහන්සේ රාජකුමාරාදීන්ගේ සිත් පරීක්ෂා කිරීමට සිතා සර්පයා සමීපයට ගොස් දීර්ඝ යැයි කියා අඬගැසූහ. දීර්ඝයා විත් බෝසතුන් වැඳ ස්වාමීනි මට සතළිස් කෙළක් ධනය ඇත. ඒ සියලු ධනයම මැත් කරවාගෙන ගිය මැනවයි කීය. බෝධිසත්වයන් මට අවශ්‍යතාවයක් ඇති වූ විට එන්නෙමියි පවසා මීයා සමීපයට ගොස් අඬගැසුවේය. මූසිකයාත් එපරිද්දෙන්ම පැවතියේය. ගිරවා සමීපයට ගිය විට එක වචනයෙන්ම ගසෙහි අතුඅගින් බැස බෝධිසත්වයන් වැඳ ස්වයංජාත ඇල්වී අවශ්‍යදැයි විචාළේය. ප්‍රයෝජනයක් ඇතිවිට එන්නෙමැයි කියා පිටත් වූ බෝධිසත්වයන් වහන්සේ රජ්ජුරුවන් කරා ගිය විට, නුවර පැදකුණු කරමින් සිටි රජ්ජුරුවෝ දුරදීම දැක කූට තාපසයා මා

සමග සිවුපසය වළඳා සිටීමට කැමැත්තෙන් පැමිණ ඇත. ඇමතියන්ගේ මුහුණ බැලූ විට, රජුගෙන් කුමක් කරන්නමෝදැයි විමසද්දී, පළමුකොටම ඔහුගේ හිස කප්පවමියි සිතා මේ කාලකන්නි තාපසයා මා දැක්ක නොදී අල්ලාගෙන මා පිටිතල හයා බැඳ සතරමංසන්ධියක් පාසා ගස ගසා නුවරින් පිටත් කොට ඔහුගේ හිස සිඳ මිනිය ගොස් දමන්නැයි විධානය කළේය.




රාජ පුරුෂයෝ රජුගේ කීම අසා නිරපරාධ වූ බෝසතාණන් වහන්සේ බැඳගෙන දංගෙඩියට ගෙනයන්නට පටන් ගත්හ. පහර දෙන හැම හන්දියකදීම "මැණියනි, පියාණෙනි, නොකියාම නොහඬා නිර්හිතකාරීව මෙසේ කීවේය. මේ ලෝකයේ සමහර නුවණැති සත්වයන් දියෙහි යන වියළි දණ්ඩක් ගොඩලීම යහපතැයි, උත්තම ප්‍රඥා පුරුෂයෝ කියන්නේ සැබෑවකි. දණ්ඩක් විපතට පත්වූවන්ගේ පිහිටට සිටින නමුත් දියෙහි පා වූ මේ පාපී පුරුෂයා දැන් මා දුකට පමුණුවන්නේය." ගැසූ ගැසූ හැම හන්දියකදීම මේ කාරණය දිගටම කීවේය.

මෙයම කියනු ඇසූ නුවණැති පුද්ගලයෝ මෙසේ ඇසූහ. පින්වත් තාපසයෙනි, තොප විසින් අපගේ රජුට කළ කිසියම් ගුණයක් ඇත්තේදැයි විචාළේය. එපවත් ඇසූ බෝධිසත්වයෝ, මම මොහු වතුරෙන් ගොඩගෙන මම ම දුකට පත් වුනෙමි. ඒකාන්තයෙන්ම පුරාතන නුවණැත්තෝ කී දෙය නොකළෙමියි සිතා මෙසේ කීවෙමියි කීහ. ඒ ඇසූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් හා නුවර වාසීන් මේ මිත්‍රද්‍රෝහී රජ්ජුරුවෝ මේ ගුණ සම්පන්න තාපසයා තමාට ජීවිත දානය දුන්නේ වී නමුත් ගුණමකුව දුකට පත්කරති. එසේම මොහු නිසා අපට ද ඇතිවන වැඩෙක් නැත. එසේ සිතා රජ්ජුරුවන්ට පහර දී ඔහු ජීවිතක්ෂයට පත් කොට බෝසතාණන් වහන්සේ අභිෂේකයට පත් කොට රජ බවට පත් කළේය.

මහබෝසතාණන් දැහැමෙන් රජ කරමින් පළමුව සර්පයා වසන තැනට ගොස් සතළිස් කෙළක් ධනය ගෙන රටවැසියන්ට දුන්හ. අනතුරුව මීයා සමීපයට ගොස් කතා කොට තිස්කෙළක් වස්තුව ගෙන අමාත්‍යයන්ට පාවා දුන්හ. ගිරවා වාසය කළ තැනට ගොස් රත්ඇල් ගෙනවිත් රටවැසියන්ට දුන්හ. එසේ කොට සර්පයාට වාසය කිරීම සඳහා රන් නළයක් කරවා, මීයාට වසනු පිණිස ස්ඵටික මාණික්‍යමය ගුහාවක් කරවා දී, ගිරවාට වාසය කිරීම සඳහා රන් මැදිරියක් කරවා දී සර්පයාට හා ගිරවාට ගොදුරු පිණිස මී හා විළඳ දී තුන්දෙනාටම සංග්‍රහ කොට පින්කම් කළේය. මේ දේවදත්ත ස්ථවිරයෝ මට වධ කළේ මේ භවයේ පමණක් නොව, පෙරත් එසේමැයි වදාළ සේක. ඒ දුෂ්ට රජු නම් දේවදත්ත ස්ථවිරයෝය. සර්පයා නම් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේය. මීයා නම් මුගලන් ස්ථවිරයන් වහන්සේය. ගිරවා නම් ආනන්ද ස්ථවිරයන් වහන්සේය. පසුව රජ කළ ධාර්මික රජු නම් තිලෝගුරු බුදුරජාණන් වහන්සේය. කළ ගුණ නොදත් දුෂ්ට ගති ඉවතලා කෘතවේදී ජීවිතයක් ගත කිරීමට මෙම ජාතක කතාව සෑම ජීවිතයකටම එක්කර ගැනීම බොහෝ අගනේය.

**කේ. මීගහකුඹුර**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."



# ශ්‍රී දළදා සමිඳු තේවාව මල්වතු මහා විහාරයට

ශ්‍රී දළදා සමිඳු උදෙසා තේවා පැවැත්වීමේ චිරාගත සාම්ප්‍රදායික චාරිත්‍රය අනුව තේවා මුරය අස්ගිරිය මහා විහාරයෙන් මල්වතු මහා විහාරයට පැවැරීම ඇසළ පුර පසළොස්වක පෝය දිනට පසුදින සිදුකෙරුණි.


පසුගිය 2016 ඇසළ පුර පසළොස්වක පෝය දින සිට ශ්‍රී දළදා සමිඳු උදෙසා තේවාව පැවැත්වීම අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක වරකාගොඩ ශ්‍රී ඤාණරතන මාහිමිපාණන් ප්‍රධාන මහා සංඝරත්නය විසින් පවත්වාගෙන ආහ. වර්ෂ 2017 ඇසළ පෝය දිනයේත් ශ්‍රී දළදා සමිඳු උදෙසා තේවාව පැවැත්වීමට තේවාව මුර මාරුවත් සමග මල්වතු මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික තිබ්බටුවාවේ ශ්‍රී මේධංකර නාහිමි ප්‍රධාන කාරක සභික සංඝරාජ පරිවේණාධිපති ශාස්ත්‍රපති මීනිගමුවේ රතනපාල, කාරක සභික මහෝපාධ්‍ය ශාස්ත්‍රපති හේනේපොල නන්දසිරි, මල්වතු මහා විහාරවාසී ලංකාතිලක රාජ මහා විහාරාධිපති අමුණුගම රාජගුරු විපස්සි, මල්වතු මහා විහාරවාසී උඩගල දෙබොක්කේ ගුණානන්ද යන හිමිවරු පත්වූහ.

මෙම අවස්ථාවට මල්වතු අස්ගිරි අතිපූජ්‍ය මහානායක, අනුනායක හිමිවරු ප්‍රධාන උභය මහා විහාරයීය මහා සංඝයා වහන්සේලා සහ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල මහතාද සහභාගි වූහ. තේවාවට පත්වූ තිබ්බටුවාවේ ශ්‍රී මේධංකර නාහිමි ප්‍රධාන තේවා සංඝයා වහන්සේලාට වස් ආරාධනාව කොත්මලේ සුධර්මා සිල් මෑණියන්ගේ ප්‍රධානත්වයෙන් දෙහිවල කවුඩාන පළල් පාරේ පටුමගේ දමිත ජයවර්ධන මහත්මා, නදීෂා ජයවර්ධන මහත්මිය ඇතුළු පවුලේ පිරිස විසින් සිදුකරන ලදී.

කේ. බණ්ඩාරනායක

බොදු පුවත්


## මකුරුප්පේ පඤ්ඤාසේකර නාහිමි නැගෙනහිර පළාත සහ තමන්කඩුව එගොඩ පත්තුවේ ප්‍රධාන සංඝනායක පදවියෙන් පිදුම් ලබති



**දෙහිඅත්තකණ්ඩිය** කැලේගම ශ්‍රී සම්බෝධි විහාරය, මතුරට වට්ටාරන්තැන්න පුරාණ විහාරද්වයාධිපති නව මැදගම ජාත්‍යන්තර බෞද්ධ සංස්කෘතික හා අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ සමස්ත ලංකා ශාසන ආරක්ෂක බල මණ්ඩලයේ සහකාර ලේඛකාධිකාරී අම්පාර දිස්ත්‍රික් ශාසන ආරක්ෂක බල මණ්ඩලයේ සභාපති මකුරුප්පේ පඤ්ඤාසේකර හිමි වෙත ''ධර්මකීර්ති ශ්‍රී ඉන්දජෝති'' යන ගෞරව නාමය සහිතව නැගෙනහිර පළාත සහ තමන්කඩුව එගොඩපත්තුව යන දෙපළාතේ ප්‍රධාන සංඝනායක පදවිය, අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ ගෞරවාර්හ මහානායක සානුනායක වර ප්‍රමුඛ ගරුතර විංශත් වර්ගික කාරක මහා සංඝ සභාව විසින් ප්‍රදානය කර ඇත.

අස්ගිරිය මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී පවත්වන ලද උත්සවයකදී අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ ගෞරවනීය මහානායක අතිපූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඤාණරතන මාහිමිපාණන් විසින් සංඝනායක පදවිය පිළිබඳ ශ්‍රී සන්නස් පත්‍රය මකුරුප්පේ පඤ්ඤාශේඛර නාහිමි වෙත සම්භාවනීය ගිහි පැවිදි දෙපිරිසගේ සහභාගිත්වයෙන් පවත්වන ලද උත්සවයකදී පසුගියදා පිරිනමනු ලැබූහ.

## ප්‍රසාද පූජාවක්



**ශ්‍යාමෝපාලි** මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ විංශත් වර්ගික කාරක මහා සංඝ සභාවේ කාරක සංඝ සභික ධුරයකින් පිදුම් ලැබූ අම්පිටිය දලුක්ගොල්ල රජමහා විහාරය, උඩුනුවර කැලියැල්පිටිය පුරාණ විහාරද්වයාධිපති උඩුනුවර උඩ පළාත ප්‍රධාන සංඝනායක මල්වතු මහා විහාරවාසී ඇටිපොල ශ්‍රී ධර්මරක්ෂිත බුද්ධරක්ඛිත හිමි විසින් මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිගෞරවාර්හ මහානායක මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ ගරුතර සානුනායක කාරක මහා සංඝ සභාව වෙත ප්‍රසාද පූජාවක් ඓතිහාසික මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී පිරිනමන ලදී.

මෙම අවස්ථාවට අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ ගරුතර කාරක මහා සංඝ සභාවේ අනුනායක හිමි ප්‍රධාන මහා සංඝයා වහන්සේලා ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල මහතා සමග බස්නායක නිලමේවරු සමග සම්භාවනීය ගිහි පැවිදි පිරිසක් සහභාගි වූහ.

## උපසම්පදාව ලබති



**අඹතැන්න** හපුගොඩ ශ්‍රී සුභද්‍රාරාම මහජන විහාරාධිපති, මාවතගම ඩෙනර්වත්ත ශ්‍රී ධර්ම විජයාරාමාධිපති, උඩරට අමරපුර නිකායේ ශාසන ජෝතික කාරක සංඝ සභාවේ කාරක සංඝ සභික මධ්‍යම පළාත් උප අධිකරණ සංඝනායක මාතලේ විද්‍යානන්ද පරිවේණාධිපති ශාස්ත්‍රවේදී බටුගොඩ සංකිච්චා යන නාහිමිගේ ශිෂ්‍ය අලවතුගොඩ කොණකලගල ශ්‍රී සද්ධානන්ද මහ පිරිවෙනේ සහ අස්ගිරිය මහා විහාරයීය මහ පිරිවෙනේ මූලික හා ප්‍රාචීන අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාලයීය ප්‍රවේශයට සුදුසුකම් ලබා සිටින සුභද්‍රාරාම දහම් පාසලේ ධර්මාචාර්ය කහවත්තේ සිරි සුබෝධි සාමණේර නම මහනුවර ගැටඹේ වරාතැන්න මහවැලිහිදී සිරිමහ බෝධි උදකුක්ඛේය සීමා මාලකයේදී උපසම්පදා ශීලයෙහි පිහිටුවනු ලැබූහ.


''නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය.''

# සදහම් ප්‍රහේලිකා අංක - 107

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773

## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේලිකාව - 107, 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදන.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය අගෝස්තු මස 25 වැනිදා බව සලකන්න.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.




### ▶ හරහට

1. දනයෙන් ලැබෙන ආනිශංස පහෙන් එකකි.
3. බුදුන් වහන්සේ බ්‍රහ්ම දණ්ඩනය පැනවූ භික්ෂුව.
5. සිදුහත් කුමරුට නම් තැබූ බමුණන් අටදෙනාගෙන් කෙනෙකි.
7. බුදු දහමේ ඉගැන්වෙන සප්ත භාර්යාවන්ගෙන් කෙනෙකි.
9. රාත්‍රියට මේවා අහස බබළවයි.
11. හේමමාලා කුමරිය සමග දන්ත ධාතුව රැගෙන ආ කුමරු.
13. බුදුන්ට සමාන අරුත ගෙන දෙන තවත් වචනයකි.
15. බෞද්ධයෝ නිරතුරුව මෙය රැකිය යුතුය.
16. සක් දෙවිඳුන් මෙම සතාගේ රූපය සඳේ ඇන්ද බවට විශ්වාසයක් පවතී.

### ▼ පහළට

2. අටලෝ දහමට අයත්ය.
4. ධ්‍යානලාභී තෙරණියන් අතරින් අගතැන්පත් තෙරණිය.
5. බුද්ධ සමාජය තුළ මෙබඳු සිටුවරුද සිටියහ.
6. මිනිසුන්ට මෙන්ම සතුන්ටද මෙය අවශ්‍යය.
8. සෑම ක්‍රියාවකටම මුල් වන්නේ මෙය බව බුදු දහමේ ඉගැන්වේ.
10. මේවාද එක්තරා යාත්‍රා විශේෂයකි.
12. මෙම හැඟීම හැමවිටම ශෝකය ලබාදෙන බව බුදු දහමේ සඳහන් වේ.
14. එද ඉන්දියාවේ තිබූ සොළොස් මහා ජනපදවලින් එකකි.

### ප්‍රහේලිකා අංක 105 ජයග්‍රාහී වාසනාවන්තයින් නම්

- දේසිත් විජේරත්න, 10/1, මංගල මාවත, වටපුලුව, මහනුවර.
- උ. ව. වනිගසේකර, 3/5, කන්දගොල්ල, කුණ්ඩසාලේ.
- සෝමා කුමාරි දිසානායක, 20/4, මාතලේ පාර, වත්තේගම.

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සෑම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර දහතුනකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න


# දළදා මාලිගයෙන් පණිවුඩයක්

- මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඳ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.


"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්."



# පිරිත් නූලේ බලය තිබෙන්නේ තුන් වරුවද?

බෞද්ධ බැතිමත්හු තම ජීවිතවල වැදගත් අවස්ථාවලදී උදා:- විවාහය, උපන් දින, විභාග, සම්මුඛ පරීක්ෂණ මෙන්ම කරදර, බාධක, දුක් පීඩා පැමිණි විටද පිරිත් නූල් බැඳ ගැනීමට පෙළඹෙති. ඇත්තෙන්ම පිරිත් නූල් බැඳීම බෞද්ධ චාරිත්‍ර අතර ඉතා සුවිශේෂී අංගයක් බව පැවැසීම නිවැරදිය.

අතීතයේදී පිරිත් නූල බැඳීම සඳහා විශාල වටිනාකමක දී තිබිණි. එනම් පිරිත් නූල් බැඳීම සිදුවුණේ ඉතාම ගෞරවයෙනි. නමුත් අද පිරිත් නූල් බැඳීම විලාසිතාවක් වී ඇති අවස්ථාද බොහෝය.



තුණුරුවන් පිළිගෙන තුණුරුවන් අදහන අයට පිරිත් නූල් බැඳ ගැනීමෙන් ආරක්ෂාවක් ලැබෙන බව සැබෑය. නමුත් පිරිත් නූල් බැඳීම අවබෝධයෙන් යුතුව කිරීම ඉතාම වැදගත්ය.

අප රටේ බෞද්ධාගම ස්ථාපිත වූයේ මහින්දාගමනයෙන් අනතුරුව බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි. විජය කුමරුගේ පැමිණීම සිදුවුණේ ඊට පෙරය. එම අවස්ථාවේදී උපුල්වන් දෙවියන් පරිබ්‍රාජක වේශයක් මවාගෙන ලංකාවට පැමිණි විජය කුමරු ඇතුළු පිරිසට පිරිත් නූල් බැන්ද බව හා ඒ මගින් ඔවුන්ට හානි කිරීමට අමනුෂ්‍යයන්ට නොහැකි වූ බව මහා වංශයෙහි සඳහන් වේ.

එම විස්තරයට අනුව මහින්දාගමනයටත් පෙර සිට පිරිත් නූල් භාවිතය අපේ රටේ පැවැති බව සිතිය හැකිය.

පිරිත් නූල් සම්බන්ධයෙන් කතා කරන විට පිරිත් නූලක බලය තිබෙන කාල පරාසය පිළිබඳවද දැනුවත් වීම ඉතා වැදගත්ය.

පිරිත් නූලක බලය තිබෙන්නේ තුන් වරුවක් පමණක් බව බහුතරයකගේ අදහසයි. එහි සත්‍යතාවක් නොමැත.

නමුත් පිරිත් නූලක් බැඳගෙන අඩුම වශයෙන් තුන් වරුවක්වත් පන්සිල් රැකීම ඉතාම වැදගත් වේ.

ඇත්තෙන්ම තුණුරුවන් පිළිබඳ විශ්වාසයෙන් පිරිසිදු දැහැමි ජීවිතයක් ගත කරන්නේ නම් (පස් පව්න් වැළකී) පිරිත් නූලේ බලය තවත් වැඩිවන බව මතක තබාගත යුතුය.

එමෙන්ම පස් පව්වල යෙදෙමින් කටයුතු කරන්නේ නම් අවම වශයෙන් තුන් වරුවක්වත් පිරිත් නූලෙන් ආරක්ෂාවක් නොලැබෙන බවත් සිහි තබාගත යුතුය.

පිරිත් නූල ඉවත් කළ පසු එය ගසක අත්තක බැඳිය යුතු බව අතීතයේ සිටම පිළිගත් කරුණක් විය. එයින් අදහස් වූයේ එය සුළඟට ගසාගෙන නොගොස් දිරාපත් වීමට ඉඩ සැලැස්විය යුතු බවය.

ඒ අනුව පිරිත් නූල පයට නොපෑගෙන ස්ථානවලට දැමිය යුතු බව පැහැදිලි වේ.

පිරිත් නූල යනු තුණුරුවන් ගුණ බලයෙන් සත්‍යයෙන් බල ගන්වන ලද ගෞරවනීය දෙයක් බැවින් එය අගෞරවයෙන යුතුව ඉවත දැමීමද නොකළ යුතුය.


ඇත්තෙන්ම පිරිත් නූල යනු අධ්‍යාත්මික ඖෂධයකි. එමෙන්ම අප ජීවිතවල කායික හා මානසික පීඩා සංසිඳුවා ගැනීමට ඇති ප්‍රබල ආරක්ෂක ක්‍රමයකි.

එම නිසා එහි ඇති බලය, ගෞරවය, ශක්තිය පිළිබඳව සැබෑ අවබෝධයක් ඇතිව පිරිත් නූල බැඳගෙන ජීවිත සුවපත් කරගැනීමට බෞද්ධ සැවොම සිතට ගත යුතුවේ.

**පූජ්‍ය කොටියාගල සීවලී හිමි**

# මධ්‍යම ප්‍රතිපදාව යනු කුමක්ද?

ඇසළ පුර පසළොස්වක පොහෝ දිනය සමස්ත මිනිස් වර්ගයාටම අතිශය වැදගත් වන්නා වූ දිනයකි. එය මිනිසා අජටාකාශගාමී වීම, සඳතරණය කිරීම ආදී කාරණාවලටත් වඩා වැදගත් වන්නේ විද්‍යාවෙන්, තාක්ෂණයෙන්, ධනයෙන්, බලයෙන්, උගත්කමින් ඉක්මවාලිය නොහැකි ජරා මරණාදී සාංසාරික දුක් ඉක්මවන මාර්ගය මිනිස් සිතකින් අවබෝධ කරගෙන දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත සත්ව ප්‍රජාවටම මිනිස් ලොවදී මිනිසුන් පස්දෙනෙක් පෙරමුණේ තබාගෙන ප්‍රකාශයට පත්කිරීමය.



චතුරාර්ය සත්‍යය සහිත ආර්ය මාර්ග ප්‍රකාශනය දේව වාක්‍යයක් හෝ දේව දූතයකු අත එවන ලද්දක් නොවීම තවත් වැදගත්කමකි. එය සම්පූර්ණ වශයෙන්ම මනුෂ්‍ය සිතකින් කරන ලද පර්යේෂණයක් තුළින් ලැබුවා වූ ප්‍රත්‍යක්ෂ අවබෝධයකි. දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව මගින් උන්වහන්සේ ප්‍රකාශයට පත්කරන ලද්දේ තමන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වූ ආකාරයයි. ඒ අනුව චතුරාර්ය සත්‍යය ධම්ම තුනකින් සහ දොළොස් ආකාරයකින් යථාභූත ඥාන දර්ශනයෙන් පිරිසිදු ලෙස උන්වහන්සේ අවබෝධ කොට වදාළ බව දේශනා කළහ.

දම්සක් පැවතුම් සූත්‍රයේදී බුදුන් වහන්සේ පළමුව අනාවරණය කළේ දීර්ඝ කාලයක් විමුක්තිය ලැබෙතැයි විශ්වාසයෙන් වඩන ලද ප්‍රතිපදා දෙකෙහි පවත්නා නිරර්ථක බවත්, තමන් වහන්සේ බුද්ධත්වයට පත්වූ මධ්‍යම ප්‍රතිපදාවේ පවත්නා ප්‍රතිඵලදායක බවත්ය.

1. කාමසුඛල්ලිකානුයෝගය

එනම් විමුක්තිය ලැබෙතැයි සිතා ශරීරය අධික සැපයට පත්කරවීමයි. මීට පදනම්ව ඇත්තේ උච්ඡේද දෘෂ්ටියයි. ඔවුහු ලෞකික සම්මා දිට්ටියෙන්ද තොරය. කර්මය, කර්මඵල, පුනර්භවය නොඅදහති. බුදුන් වහන්සේ පහත වචනවලින් මේ මාර්ගයේ පවත්නා ආදීනව පෙන්වා බැහැර කළ යුතු බව පෙන්වා තිබේ. හීනෝ - ලාමකය. ගම්මෝ - ග්‍රාම්‍යය. පොථුජ්ජනිකො - පෘථග්ජනය. අනරියො - අනාර්යය. අනර්ථසංහිතො - අර්ථ විරහිතය.

පව් - පින්, කර්මය, කර්ම ඵලයද විශ්වාස නොකරමින් යෙදෙන මෙම මාර්ගය තුළින් විමුක්තිය කිසිසේත් සාක්ෂාත් නොවන්නා සේම සම්මුති සමාජයේ සාරධර්ම, සදාචාරයද පිරිහෙලන හෙයින් මෙය වචන පහකින්ම බැහැර කොට තිබේ.

2. අත්තකිලමථානුයෝගය

මෙයින් අදහස් වන්නේ විමුක්තිය අපේක්ෂාවෙන් තම ශරීරය අධික ලෙස වෙහෙසට පත්කරවීමය. ඔවුහු කල්පනා කළේ එමගින් තම ආත්මයේ කර්ම ගෙවීයාමෙන් අනතුරුව ඥානය පහළ වන බවත් එමගින් විමුක්තිය ලද හැකි බවත්ය. මේ දෘෂ්ටිය දරූ අය ශාස්වත වාදීහුය. නොයෙක් ව්‍රත සමාදන් වෙමින් ඔවුහු පාරිශුද්ධිය බලාපොරොත්තු වූහ. බුදුන් වහන්සේ සය වසරක් තිස්සේ ලැබූ අත්දැකීම් තුළින්ම එහි අරුත්සුන් බව දුක්ඛො - දුක් සහිතය, අනරියො - අනාර්යය, අනත්ථසංහිතො - අනර්ථවත්ය වශයෙන් පෙන්වා දුන්හ.

මධ්‍යම ප්‍රතිපදාව (මජ්ඣිමා පටිපදා) යනු මේ අන්ත දෙකම නොවේ. මේ අන්ත දෙකට මැද තිබෙන්නක්ද නොවේ. මේ අන්ත දෙක සමව ගෙන තනාගත් මගක්ද නොවේ. එය වනාහී මේ අන්ත දෙකින් සම්පූර්ණයෙන්ම මිදුණු පෙර නොඇසූ විරූ මගකි. ඒ මග නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. පෙර කී අන්ත දෙකටම පදනම්ව ඇත්තේ සත්ත්ව පුද්ගල, ආත්ම වශයෙන් ගත හැකි යමක් පවතී යන දෘෂ්ටියයි. බුදුන් වහන්සේ ඇත (අත්ථි) නැත (නත්ථි) යන අන්තවලින් මිදී සියල්ල බෙදා වෙන්කර පෙන්නූහ. එමගින් ආත්මීය වශයෙන් ගත හැකි කිසිවක් නැති බව පෙන්වූහ. ඒ දෘෂ්ටිය මත පිහිටා දුක් සහිත ලෝකයෙන් අත් මිදෙන ප්‍රතිපදාව වශයෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය වදාළහ. එය කරුණු කිහිපයක් පිණිස පවත්නා බව ධම්මචක්ක සූත්‍රයේ එයි. 1. **චක්ඛුකරණී** - ප්‍රඥා චක්ෂුසය, පිරිසිදු කරනු පිණිස, 2. **ඥාන කරණී** - නුවණැස ඇතිකරනු පිණිස, 3. **උපසමාය** - කෙලෙසි සංසිඳවනු පිණිස, 4. **අභිඤ්ඤාය** - සත්‍ය ප්‍රතිවේධ කරනු පිණිස, 5. **සම්බෝධාය** - තමන්ගේම අවබෝධය පිණිස, 6. **නිබ්බාණාය** - නිර්වාණාවබෝධය පිණිස වශයෙන් එහි දැක්වෙයි.


ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග අටකි. එය සීල, සමාධි, ප්‍රඥා වශයෙන් බෙදෙන අතර අනුපිළිවෙළින් පූරණය කළ යුතුය.

**සම්මා දිට්ඨි, සම්මා සංකප්ප (ප්‍රඥා)**
**සම්මා වාච, සම්මා කම්මන්ත, සම්මා ආජීව (සීල)**
**සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි (සමාධි)**

මේ සියල්ලටම පදනම් වන්නේ සම්මා දිට්ඨියයි. කර්මය, කර්මඵල, දෙමව්පියන් ඕපපාතික උප්පත්තිය සිත දියුණු කොට ඵල, සමාපත්ති, මාර්ග ලැබීමේ ශක්තිය පිළිගැනීම ආර්ය මාර්ග යෙහි ලා වන ලෞකික සම්මා දිට්ඨියයි. එය ඇතිකර ගත් තැනැත්තා සීලයෙහි පිහිටා චිත්ත සමාධිය වඩා සමාධිවත් වූ සිතින් විදර්ශනා ප්‍රඥාව උපදවාගෙන ත්‍රිලක්ෂණාවබෝධය ලබයි. හෙතෙම චතුරාර්ය සත්‍යාවබෝධයෙන් සම්මා ඥාන, සම්මා විමුක්ති යන අංග දෙකද සාක්ෂාත් කොට දසංග සමන්වාගත උතුම් අරිහත් ඵලය ලබා ජරා මරණාදී සසර දුක් ගිනි නිවාලයි. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ලෝකෝත්තර පක්ෂය එසේ වෙද්දී එය එදිනෙදා ජීවිතයට බද්ධ කරගත යුතු ප්‍රායෝගික ප්‍රතිපදාවක් බවත් සිහි තබා ගත යුතුය.

**මල්වතු මහා විහාරවාසී - පූජ්‍ය හෙම්මාතගම පියදස්සි හිමි**

''ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි.''




# හද පිරි බැතියෙන් දළදා මාළිගාව නමින් ඔබේ පරිත්‍යාගය mCash සමඟින්

mCash එසැණින් මුදල්

**ඔබ mCash පාරිභෝගිකයෙක් නම් :**

- #111# අමතන්න
- Option 4 - Aayathanika Geweem තෝරන්න
- Option 3 - Parithyaaga තෝරන්න
- Option 1 - Sri Dalada Maligawa තෝරන්න
- mCash PIN අංකය ඇතුළත් කරන්න
- දුරකථන අංකය ලෙස ඔබේ ජංගම දුරකථන අංකය ඇතුළත් කරන්න
- පරිත්‍යාග කිරීමට කැමති මුදල ඇතුළත් කරන්න
- SMS පණිවිඩයකින් ගනුදෙනුව තහවුරු කෙරේ

**ඔබ mCash පාරිභෝගිකයෙක් නොවන්නේ නම් :**

- ළඟම සිටින mCash අලෙවි නියෝජිතයා හමුවන්න
- ශ්‍රී දළදා මාළිගාවට ඔබ මුදල් පරිත්‍යාගයක් කරන බව සඳහන් කරන්න
- ඔබේ දුරකථන අංකය සමඟ පරිත්‍යාග කරන මුදල සඳහන් කරන්න
- අදාළ මුදල mCash නියෝජිතයාට ලබා දෙන්න
- SMS පණිවිඩයකින් ගනුදෙනුව සහතික කෙරේ

**භාවිත කිරීම සඳහා #111# අමතන්න**

වැඩි විස්තර සඳහා 7111 අමතන්න නැතිනම්
www.mobitel.lk/mCash වෙත පිවිසෙන්න.

සරලව
සුරක්ෂිතව
සැණෙකින්

දුරකථන ජාල හවුල්කරුවන්

Sri Lanka Telecom Mobitel

etisalat

mCash එසැණින් මුදල්



# මරණයෙන් පසු අප යන්නේ කොතැනටද?

## අවමඟුල් උත්සව සම්බන්ධ මිථ්‍යා මත විමසා බලමු

උපන් හැම සත්වයකුම මරණය දායාද කර ගත්තෝ වෙති. මරණයත් සමග පුද්ගලයා එම භවය අවසන් කරනු ඇත. එක් භවයක් යනු සත්වයකුගේ සංසාර ගමනේ එක් නවාතැනක් පමණි. කෙනකු මියගිය පසු එම මියගිය පුද්ගලයාගේ අවමංගල කටයුතු සිදු කරන ආකාරය ජාතියෙන් ජාතියට මෙන්ම ආගමෙන් ආගමට පවා වෙනස්ය. බෞද්ධයන් මිථ්‍යාව තුළ දැඩිව එල්බ ගන්නා එක් අවස්ථාවක් වන්නේ පවුලේ කෙනෙකු මිය යාමයි. අප මේ එකිනෙක මිථ්‍යා මත වෙන වෙනම ගෙන පුළුල්ව විමසා බලමු. මේ අනුව ඔබ කෙතරම් මිත්‍යාවන්ට එල්බ ගෙන කටයුතු කර ඇතිද යන්න ඔබටම වටහා ගත හැකිවනු ඇත.

### පවුලේ කෙනකු මියගිය පසු මියගිය වේලාවෙහි සුබ අසුබ බැලීම

අප උපදින්නේ අපට හෝ අපේ මව්පියන්ට අවශ්‍ය වෙලාවට නොවේ. මරණයද එසේමය. නොකියා මෙලොවට පැමිණි අයුරින්ම සියලු සත්වයන් නොකියාම මෙලොව හැර යාමද සිදුවනු ඇත. ඒ අනුව පවුලේ කෙනකු මියගිය පසු එම මරණය සිදුවූ වේලාවෙහි සුබ අසුබ ජ්‍යොතිර්ශාස්ත්‍රඥයකු ලවා බලවා ගැනීම යනු අන්තිම අදූරදර්ශී ක්‍රියාවකි. මෙය නියම බෞද්ධයකු විසින් සිදුකළ යුත්තක් නොවේ.

අපේ ශරීරය අප උපන් දා සිටම කිලුටු වීම, නරක් වීම සිදුවෙයි. අප දිනපතාම මේ මුළු සිරුරම හොඳින් පිරිසිදු කරන්නේ ඒ නිසාය. එක දිනක් හෝ නාන්නට, ඇඟ සෝදන්නට බැරි වුණොත් අපේ සිරුරෙන් මොනතරම් දුගඳක් පිටවේදැයි සිතා බලන්න.

ජීවත්ව සිටියදී මෙසේ නම් මියගිය පසු එය කෙසේ වේවිදැයි සිතා ගත හැකිද? ඇත්තෙන්ම එවිට එම විෂබීජ පරිසරය පුරාම පැතිරෙනු ඇත.

නමුත් කුණු ගොඩක් නිවසින් පිට කරන්නට අපි නැකත් බලමු. හොඳ නැකතක් නැත්නම් එය දිනකින් දෙකකින් හෝ ඊට වැඩියෙන් වුවද කල් ගැනීමටද අප සූදානම්ය. මොහොතින් මොහොත නරක් වී මැස්සන්, කූඹියන් වැනි සතුන් විසින් වෙලා ගනු ලබන, දුගඳ හමන කුණු ගොඩක් ඉවත ලෑමට නැකැත් බැලීම මොනතරම් විහිළුවක්ද?

අවංකවම සිතා බැලුවොත් මෙසේ මියගිය පුද්ගලයා මියගිය වේලාවේ ඇති සුබ අසුබ අප සොයා බලන්නේ මියගිය තැනැත්තාට යහපතක් කිරීමේ අභිප්‍රායෙන් නොවේ. ජීවත්ව සිටින අපට කරදරයක් වේදැයි යන සැකය හා බිය නිසාය.

හොඳයි, ඔබේ ඥාතියා මියගිය වෙලාව අසුබ යැයි අපි උපකල්පනය කරමු. හොඳ වුණත්, නරක වුණත් දැන් ඔබේ ඥාතියා මියගොස් අවසානය. එය වෙනස් කිරීමේ හැකියාවක් මිහිපිට කිසිවෙකුටවත් නැත. එසේ නම් මියගිය වෙලාව අසුබ යැයි ජ්‍යොතිශාස්ත්‍රඥයා කිවහොත් අපට සිදුවන්නේ අප ගැනම බියෙන් හුල්ලමින් ඉදිරි කාලය ගත කරන්නට නොවේද?

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"

මෙසේ නැකැත් බැලීමේදී මෘත දේහය නිවසින් පිටතට ගත යුතු දිශාවක්ද බොහෝ ජ්‍යොතිශාස්ත්‍රඥයෝ නියම කරති. යම් හෙයකින් එතැන දොරක් නොතිබී ජනේලයක් තිබුණොත් ජනේලය ගලවා දේහය පිටතට ගන්නට පවා සිදුවේ. මෙසේ කළ අය පිළිබඳව අපට කොතෙකුත් අසන්නට ලැබී ඇත. අවමඟුල වෙනුවෙන් සහ දානමාන කටයුතු වෙනුවෙන් වැය කරන්නට සිදුවන මුදල මදිවාට දූන් අමතර වියදමක් දැරීමට සිදුව ඇත. ඒ එලෙස ගල්වා දැමූ ජනේලය හෝ ජනේලයක් නොතිබී එතැන බිත්තිය පමණක් තිබුණේ නම් කඩා දැමූ බිත්තිය පිළිසකර කරන්නට යන වියදමය. ඉවත දැමිය යුතු කුණු ගොඩක් වෙනුවෙන් මිනිස්සු මොන තරම් මිථ්‍යා මත කර තබාගෙන යන්නෙහුද? මේවා පරපුරින් පරපුරට ගමන් කිරීම ලොකු ඛේදවාචකයකි.

බුදුරජාණන් වහන්සේ මෙලෙස දේශනා කළ සේක.

අචිරං වතයං කායෝ<br>
පඨවිං අධිසස්ති<br>
ඡුද්දෝ අපේත විඤ්ඤාණෝ<br>
නිරත්තං ව කලිංගරං

(මේ කය ඒකාන්තයෙන්ම අස්ථිරයි. එය පොළොව හරහා වැටෙනු ඇත. එසේ පොළොව හරහා වැටෙන්නේ ශරීරය සමග බද්ධ වී තිබූ විඤ්ඤාණය ශරීරයෙන් බැහැර වූ දාටය. අඩුම තරමින් මෙහි දර කැබැල්ලක් තරම්වත් වටිනාකමක් නැත.)

මේ අවසන් පේළිය ගැන අවධානය යොමු කරන්න. ගසක් මැරී පොළොවට ඇද වැටුණු විට එහි මුලේ සිට සිහින් අතු ඉපල් දක්වාම ළිප දල්වන්නට ප්‍රයෝජනයට ගත හැකිය. එහෙත් මියගිය පසු මෘත දේහයෙන් එබඳු ප්‍රයෝජනයක්වත් ලද හැකි නොවේ.

ශරීරය සමග එකට තිබූ විඤ්ඤාණය අතහැර යාම මරණයයි. අප සෙවිය යුතු වන්නේ එසේ ඇද වැටුණු ශරීරය ගැන නොවේ. පිටත් වී ගිය විඤ්ඤාණය පිළිබඳවය. අපට භවයක් භවයක් පාසා ලැබුණ හැම ශරීරයක්ම හැර දමා ආවෙමු. දූන් මේ භවයේ අපට තවත් ශරීරයක් ලැබී ඇත. ඒ ශරීරයද යම් දිනක එලෙසම හැම දමා යාමට සිදුවෙයි. එනිසා ඔබේ මියගිය ඥාතියා හෝ විඤ්ඤාණයට පින් අවශ්‍යයද යන්න ගැන සැලකිලිමත් විය යුතුය. ඒ මිස වැඩකට නැති කුණු ශරීරය නිවසින් පිටතට ගන්නට නැකැත් බැලීම කිසිසේත්ම පලකට නැති ක්‍රියාවකි. එය තනිකම මිථ්‍යා විශ්වාසයක් වේ.


**දේහයේ ඉහ ඉද්දරින් පහනක් දැල්වීම**


දේහයේ ඉහ ඉද්දරින් පහනක් දැල්වීම තුළ ඉතා වැදගත් කතාවක් තිබේ. සමහරුන් පවසන්නේ මෙය සංස්කෘතික ලක්ෂණයක් බවය. එසේම එය මගින් විෂබීජ නැසෙන බවද පිළිගැනේ. කෙසේ වුවද මේ කරුණු දෙකෙහිම සත්‍යයක් ඇත. එසේම මෙමගින් පිළිබිඹු වන ප්‍රබලම සත්‍යය වන්නේ පවුලේ අයට මෙන්ම අවමඟුල් උත්සවයට සහභාගි වන්නන්ට පවා ජීවිතය පිළිබඳ විශාල පණිවුඩයක් කියා දීමය. ඒ කුමක්ද?

ජීවිතය පවතින්නේ ආයුෂ හා කර්මය පදනම් කරගෙනය. පහන දැල්වෙන්නේ තිරය හා තෙල් නිසාය. මේ පහනේ තෙල් තිබියදීම තිරය දැල්වී ගොස් ක්‍රමයෙන් තිරය කෙටි වී අන්තිමේ පහන නිවී යාමට පුළුවන. තෙල් ඉතිරිව තිබුණත් තිරය ප්‍රමාණවත් නොවීම මත මෙසේ සිදුවේ. මෙලෙසින්ම ජීවත් වන අපද ආයුෂ තිබුණත් කර්ම අවසන් වීම නිසා අකාලයේ මිය යා හැකිය. මෙය බුදු දහමේ දක්වන්නේ සම්මන්තක මරණය ලෙසිනි.

තිරය ඉතිරිව තිබියදී පහනෙහි තෙල් ඉවර වුවහෙත් එහිදීත් පහන අකලට නිවී යනු ඇත. ඒ අයුරින් කර්ම ඉතිරිව තිබුණත් ආයුෂ අවසන් වුවහොත් එවිටද මරණය සිදුවේ. මෙය ආයුක්ඛය මරණය නම් වෙයි.

තෙල් අවසන් වී, තිරයද දැල්වී ඉවර වුවහොත් එවිටද





පහන නිවේ. ආයුෂ සහ කර්මය යන දෙකම එකවිට අවසන් වීම නිසාද අප මිය යනු ඇත. එය උභයක්ඛය මරණයයි.

එසේම පහනේ තෙල් සහ තිරය යන දෙකම හොඳින් පවතිද්දීම සුළඟට මෙන්ම කාගේ හෝ අතක් පයක් ඉබේ වැදීම නිසා පෙරළීම වැනි දේකින් පහන අකලට නිවී යා හැකිය. මෙය ආයුෂ සහ කර්මය යන දෙකම තිබියදී හදිසියේ සිදුවිය හැකි මරණයයි. මේ තත්ත්වය හඳුන්වන්නේ උපච්ඡේදනය මරණය ලෙසිනි.

ඕනෑම මරණයක් සිදුවන්නේ මේ සිව් ආකාරවලින් එක් ආකාරයකට අනුවය. මෘත දේහයක ඉහ ඉද්දර දැල්වෙන පහනේ පරමාර්ථය මේ සත්‍යය ජීවත් වන්නවුන්ට අවබෝධ කරදීමය. මෙය තමන්ගේ ජීවිතයට උපමා කර ගැනීම සුදුසුය.

**පූජ්‍ය පිටිගල ධම්මවිනීත හිමි**

ලොකෙකනාථ වදනම්බුජ රාජහංසං
වෙනෙය්‍ය කොමුදවනං කිර ජොතයන්තං
සෙට්ඨං මහග්ඝ වරරූප විරාජමානං
වන්දාමි වාමමමලං ජිනදන්ත ධාතුං

(දන්ත ධාතූන් වහන්සේ වඳින ගාථාව)



පින් සිතින් මුද්‍රණ දායකත්වය

**ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම**

බුදුසරණ | Daily News | සිළුමිණ | දිනමිණ | SUNDAY OBSERVER
தினகரன் | தினகரன் | තරුණී | සරසවිය | සුබසෙත
නවයුගය | ක්‍රීඩා | මිහිර

මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේ තුමා විසින් ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (ලේක් හවුස්) මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.